

මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණමිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහමෙව්නාව භාවනා අසපුව

ශ්‍රද්ධා රූපවාහිනිය

ලක්විරු ගුවන්විදුලිය LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
ඇයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

නමෝ බුද්ධාය!

ව්‍යවහාර වර්ෂ 2020ක් වූ පෙබරවාරි මස 06 දින දී ය.

පින්වත් දුවේ පුතේ,

මේ ලෝකයේ ජීවත් වන ලක්ෂ සංඛ්‍යාත දූ දරුවන් අතරේ ඔබ බොහෝ සෙයින් ම වාසනාවන්ත දරුවෙක්. අතිශයින් කලාතුරකින් ලෝකයට පහළ වන සම්මා සම්බුදුරජාණන් වහන්සේනමකගේ ශාසනය නිර්මලව විරාජමාන වන පින්බර රටක, ඒ ධර්ම දායාදය ලැබූ පින්වත් දරුවෙක් ලෙසයි ඔබ ඉපිද සිටින්නේ. ඔබ වැනිම වූ අපමණ පිරිසකට අහිමි වූ මහානීය උරුමයක් තමයි ඒ ආකාරයෙන් උපතින් ම ඔබට ලැබී තිබෙන්නේ.

මේ වාසනාව හැමදාමත් මේ අයුරින් ම අප හමුවේ පවතියි කියා සිතන්නට එපා. සියලු දෙයින් පිරිහී යන ලෝකයක බුද්ධ භාෂිතය හැමදාටමත් නිර්මල ව, නොකිලිටි ව පවතින්නේ නැහැ. අද සමාජයේ ජීවත් වන වයස අවුරුදු හතළිහ - පනහ ඉක්මවූ වැඩිහිටියන්ට ඔවුනගේ ළමා කාලයේ දී මේ ධර්මය මෙතරම් පැහැදිලි ව අසන්නට ලැබුණේ නෑ. ඔබේ දෙමව්පියන්ගෙන් විමසීමක් කළොත් ඔබට එකල වටපිටාව ගැන යම් තරමකින් හෝ තේරුම් ගන්නට හැකි වේවි. කලින් කල බිහි වූ උතුම් සත්පුරුෂයන් වහන්සේලා විසින් තමයි තථාගත ශ්‍රී සද්ධර්මය දෙව්මිනිස් ලෝකයාගේ යහපත පිණිස යළි යළිත් නිර්මල ව බබළවනු ලැබුවේ. මහත් වූ පිනකට ඔබට - අපට ඉපදෙන්නට ලැබුණේ එවන් උතුම් සත්පුරුෂයාණන් වහන්සේලා සම්බුද්ධ ශාසනයේ බැබළීම පිණිස උදාර ශාසනික මෙහෙවරක නියැළෙමින් සිටිනා අවදියක යි.

පින්වත් දුවේ පුතේ, අද වුණත් ඔබට නිර්මල ධර්මය ම පමණක් ඇසෙනවා කියා අප කියන්නේ නැහැ. ඔබට ධර්මයත්, ධර්මය නමින් ම පවසන අධර්මයත් අසන්නට ලැබෙනවා. ඇතැම් විට ධර්මයට වඩා අප කරා පැමිණෙන්නේ ධර්මය නමින් පවසන අධර්මය වන්නට පුළුවනි. එවන් අවස්ථාවල දී පුණ්‍ය වාසනා මහිමයකින් ලද මේ මිනිස් ජීවිතයේ සුන්දර ම උරුමය වූ සම්බුදු සසුනේ ශ්‍රාවකත්වය නසා ගන්නේ නැතිව තථාගත ශ්‍රී සද්ධර්මය ම මැනැවින් තෝරා බේරාගෙන පුරුදු පුහුණු කිරීමේ හැකියාවක් අපට තිබිය යුතු වනවා. එසේ නොවුණහොත් අප ධර්මය යැයි කියා අධර්මය සරණ ගොස් සසරේ විපතට පත් වීම වැළැක්විය නොහැකි යි.

ඉතින්, නොයෙක් මාධ්‍යයන් ඔස්සේ ඔබ වෙත පැමිණෙන කරුණු කාරණා අතරින් පිරිසිදු ධර්මය වෙන් කර ගන්න ඔබ දක්ෂ වෙන්න ඕනේ. එයට උපකාරක කරුණු කිහිපයක් අපි සිහිපත් කර දෙන්නම්. පින්වත් දුවේ පුතේ, යම් දේශකයාණන් වහන්සේනමක් ධර්මය දේශනා කරද්දී "මේ තමයි තථාගත බුද්ධ වචනය" කියා පෙළ දහමේ ඒ ධර්ම පර්යාය සහිත වූ තැන පැහැදිලි ව දක්වමින් බුද්ධ දේශනා අනුසාරයෙන් ම දහම් කරුණු පැහැදිලි කොට දෙනවා නම්, "මා අවබෝධ කළේ මෙසේයි" ආදී වශයෙන් තමාගේ අවබෝධයක් ඉස්මතු නොකරනවා නම් අපට ඒ දේශකයා කෙරෙහි යම් විශ්වාසයක් තබන්නට පුළුවනි. නමුත් එපමණකින් ම එය තථාගත බුද්ධ වචනය ලෙසින් ගන්නට එපා.

සම්බුදු ළය මඬලින් උපන් අරහත් සඟ පරපුර ලෝ සසුන් වැඩ පිණිස තථාගත බුද්ධ වචනය ග්‍රන්ථාරූඪ කළේ මේ පින්බිමේ දී. ඒ ධර්ම පර්යායන් අදටත් ජීවමාන ව අප හමුවේ වැඩ සිටිනවා. ඔබට තේරුම් ගත හැකි ඔබේ භාෂාවෙන් ඒ ධර්මය කියවන්නටත්

ඔබට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ නිසා, ධර්මය - අධර්මය වෙන් කර ගැනීම පිණිසත්, පිරිසිදු - නිරවුල් දහම් දැනුම දියුණු කර ගැනීම පිණිසත් ඔබ ඒ උතුම් ත්‍රිපිටක ග්‍රන්ථ පරිශීලනය කරන්නට පුරුදු වන්න. එවිට ඔබට දහම් මග වැඩෙන්නට උපකාරක වන පරිදි ධර්මයෙන් අනුග්‍රහ කරන සැබෑ ම කල්‍යාණමිත්‍රයන් වහන්සේලා හඳුනාගන්නට හැකියාව ලැබෙනවා. එසේ හඳුනාගන්නා කලණමිතුරන් ගෞරවයෙන් ඇසුරු කරන්න. ඔබට මේ ජීවිතයේ දී ද පරලොව ජීවිතයේ දී ද නිවන් මාර්ගයේ දී ද අපමණ සැපය පිණිස, යහපත පිණිස, හිතසුව පිණිස ඒ කල්‍යාණමිත්‍ර ඇසුරයි උපකාරක වන්නේ.

ධර්මය ඇසුරු කරමින්, කල්‍යාණමිත්‍රයන් වෙන් කොට ගනිමින් සුවසේ දෙලොව යහපත සළසන, අමා නිවනට මග කියන දහම් ප්‍රතිපදාව පුරුදු පුහුණු කරන්නට ඔබට තෙරුවනේ ආශීර්වාදය ලැබේවා!

**ඔබට තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. චුන්ද සූකරික ඌරු වැද්දාගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 17

03. දේවධම්ම ජාතකය 25

04. සුගති රැකවරණ සළසන අසිරිමත් ගාථා 39

05. නිර්මාණ ඉසව්ව 47


06. රතන සූත්‍රය 62

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

**(යමක වර්ගය)**

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



කරන කලට පව් මීරි ය මී සේ - විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ

# චුන්ද සූකරික ඌරු වැද්දාගේ කථා වස්තුව

## "පව් කරන කෙනාට උරුම වෙන්නේ ශෝකය විතරයි."

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපි පව් ගැන අහලා තිබෙනවා. පින් ගැනත් අහලා තියෙනවා. පව් කියන්නේ දුක ලබාදෙන දෙයටයි. පින කියන්නේ සැප ලබාදෙන දෙයටයි. පව් කරන කෙනාගේ ඉරණම කොතරම්ම දුක්ඛිතද කියලා අපට නම් සිතලාවත් ඉවර කරන්න බැහැ. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ යම් කෙනෙක් දුකට බය නම්, දුකට අකැමැති නම්, එළිපිටවත් රහසේවත් පව් කරන්න එපා කියලයි. ඉතින් සමහර අය පව් කරන්න හරි කැමැතියි. එහෙම වෙන්නේ ඇයි කියලා අපට හිතාගන්න අමාරුයි. පින තිබෙද්දී පව තෝරාගන්නවා. එතකොට එයා පින අත්හරිනවා, පව් රැස් කරනවා. එවැනි අවාසනාවන්ත පුද්ගලයෙක් ගැන කථාවක් කියා දෙන්නයි අපි මේ සූදානම් වන්නේ.

පින්වතුනේ, පින්වත් දරුවනේ, සැවැත් නුවර ජේතවනාරාමය ගැන අපි කියූ විස්තර ඔබට මතක ඇති. ඒ ලස්සන ජේතවනාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටියා. බොහෝ දෙනෙක් සැඳෑ යාමයේ මල් අරගෙන බුදුරජාණන් වහන්සේව බැහැදකින්න යනවා. උන්වහන්සේට මල් පූජා කරනවා. උන්වහන්සේ ලස්සන බණ කථා කියලා දෙනවා. ජීවිතය යහපත් කරගන්න වුවමනා හැමදෙයක්ම කියා දෙනවා. ඉතින් හැමෝටම හරිම සතුටුයි. සතුන් මර මරා හිටපු අය එයින් වැළකුණා. සොරකම් කරමින් සිටි අය එයින් වැළකුණා. සල්ලාල ජීවිත ගෙවපු අය ඒ වැරදි ජීවිතය අත්හැර දැම්මා. බොරු කිය කියා හිටපු අය සත්‍යවාදී වුණා. මත්පැන් බොන

අය, පෙරන අය ඒ සියලු දෙය අත්හැරියා. කොයිතරම් හොඳද! අපි අහල තියෙනවා යමක් නිතර දකින්න ලැබෙන කොට ඒකෙ වටිනාකම පෙනෙන්නේ නෑ කියලා. ඒ වගේ ජේතවනාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටිනවා, උදේ වරුවේ පිණ්ඩපාතේ වඩිනවා. හැමතැනම රහතන් වහන්සේලා වැඩසිටිනවා, චතුරාර්ය සත්‍ය ධර්මය ඇහෙනවා, ඒ වුනාට ඇතැම් අයට ඒ ගැන කිසි වටිනාකමක් පෙනෙන්නේ නෑ.

ජේතවනාරාමය පිටුපස එවැනි පුද්ගලයෙක් හිටියා. ඔහුට ජීවිතය ගැන කිසි අවබෝධයක් නැහැ. අවබෝධ කරගන්න ඕනකමකුත් නැහැ. ඒකටම ගැළපෙන නෝනා කෙනෙකුයි, ළමයි ටිකකුයි සිටියා. මේ තැනැත්තා ඌරන් මරන පුද්ගලයෙක්. ඒක මෙයාගේ රස්සාව. යම් හෙයකින් ජේතවනාරාමයට ගොඩවෙලා බණ පදයක් ඇසුවා නම්, ඒ හැම පවක්ම අත්හැරලා වෙන රස්සාවක් සොයාගෙන සැනසිල්ලේ ජීවත් වෙන්න තිබුනා. නමුත් සිතන්න බැරි කෙනා එවැනි දෙයක් කල්පනා කරන්නේ නැහැ. මෙයා කල්පනා කළේ ඌරන් මරන හැටි විතරයි. මරන්න කලින් ඌරාව කණුවක තද කොට ගැටගහනවා. ඊට පස්සේ ලොකු මුගුරක් අරගෙන උගේ මස් තැලෙන්න කියලා ඌට දරුණු විදිහට පහර දෙනවා. හොඳට තැලුණු ඌරු මස හරි මෙලෙක්ලු. එහෙම හිතලයි මේ පව්කාරයා අහිංසක ඌරාට පහර දෙන්නෙ. ඊට පස්සේ වේදනාවෙන් කෑ ගසන ඌරාගේ කට යකඩ කොක්කකින් පළල් කරනවා. ලෝදිය වගේ උණුවතුර උගේ කටට වක්කරනවා. ඌ කෑගහද්දී බඩඑළිය යනවා. ඊට පස්සේ උගේ බෙල්ල කපනවා. ලේ ටික වෙනම භාජනයකට ගන්නවා. ඒ ගෙදර අයට කෑම පිණිසයි. අන්තිමේදී මස් කරලා විකුණනවා.

වයස පනස් පහ වනතුරුම මේ පුද්ගලයා කළේ ඌරන් මරපු එකමයි. මේ අවාසනාවන්ත පුද්ගලයාට සිල් රැකීමේ වාසනාව අහිමි වුණා. රහතන් වහන්සේලා පිඬුසිඟා වඩිද්දී දානෙ ටිකක් පූජා කරගැනීමේ වාසනාව අහිමි වුණා. බුදු බණ අසා සිත පහදවා ගැනීමේ වාසනාව අහිමි වුණා. ටිකෙන් ටික මෙයා අසනීප වුණා.

දින කිහිපයක් එක දිගට ඌරන් මරන හඬ චුන්ද සූකරිකගේ ඌරුමඩුවෙන් ඇහෙන්න පටන් ගත්තා. සමහර ස්වාමීන් වහන්සේලා හිතුවේ මොකක් හරි උත්සවයක් වෙනුවෙන් මේ ඌරන් මරන බවයි. අන්තිමේදී ඇත්ත හෙළි වුණා. එතැන වෙලා තිබෙන්නේ ඌරන් මැරීමක් නොවෙයි. චුන්දසූකරික මරණාසන්න වෙලා දවස් ගණනාවක් තිස්සේ පණ අදිනවා. මෙයා ඉදිරියෙහි යමපල්ලෝ ඇවිදින් ඌරන්ව මැරූ ආකාරයට මෙයාව මරන්න සූදානම් වෙනවා. එතකොට මෙයා හොඳටම බය වෙනවා. හයියෙන් කෑ ගහනවා. යටිගිරියෙන් කෑගහනවා. එතකොට ඇහෙන්නේ ඌරෙකුගේ විලාපයමයි. මෙයා සතියක්ම දුක් වින්දා. ඌරෙක් වගේ හඬ හඬා අවසන් හුස්ම පොද හෙළුවා. මෙයා ඉපදුණේ කොහේද කියලා දැනගන්න බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණි අය මෙයාගෙ මරණය ගැන දැනුම් දුන්නා. එවේලෙහි බුදුරජාණන් වහන්සේ වදාළේ මේ චුන්දසූකරික අවීචි මහනරකයෙහි ඉපදුණු බවයි. දැන් යමපල්ලන්ගෙන් නොයෙක් වද වේදනා විඳින බවයි. ඒ කරුණ අරහයා බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව වදාළා.

**ඉධ සෝචති පෙච්ච සෝචති - පාපකාරී උභයත්ථ සෝචති**
**සෝ සෝචති සෝ විහඤ්ඤති - දිස්වා කම්ම කිලිට්ඨමත්තනෝ**

පව් රැස් කරනා මිනිසා - මෙලොව ශෝක වෙයි එනිසා
පරලොවදිත් ශෝක වෙමින් - දෙලොවම දුක් වෙයි එනිසා
තමා විසින් රැස් කරගත් - පව් ගැන සිහිපත් වෙන විට
ශෝක වෙවී දුක් විඳිමින් - තැවෙයි නිතර දුකින් යුතුව

පින්වතුනේ, පින්වත් දරුවනේ, පව් කරන කෙනා එයට වසඟ වෙනවා. අන්තිමේදී එයාට පවෙන් නිදහස් වෙන්න බැරිව යනවා. පින් කරන්න පුළුවන් හැකියාව ටික ටික නැති වෙලා යනවා. පිනක් මතක් වුණත් පව් බලවත් නම්, සිත පිනට යොමු කරගන්න අමාරුයි. ආයෙ ආයෙමත් පුරුදු කරපු පවටම සිත නැඹුරු වෙනවා.

මේ නිසා පවේ ඇති භයානකකම නිතර නිතර සිහි කරන්නට ඕන. පව්වල භයානක විපාක ගැන බුදුරජාණන් වහන්සේ පෙන්වා දී වදාළ දහම් කරුණු නිතර නිතර සිහි කරන්න ඕන. දුකට අකමැති වෙන්න ඕන. දුක ලැබෙන්නේ පව හේතු කරගෙන නිසා ඒ පව දුරින්ම දුරු කරන්න ඕන.



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*පින්වත් දුවේ,*

*ඔයාලගේ සැප සනීප කෙසේ ද? අප සුවෙන්. මෙවර වාර විභාගයට හොඳින් මුහුණ දුන්න ද? ලකුණු දැන ගන්න ආසයි. ඉතින් දුවේ හොඳට ඉගෙන ගන්න. රටට, ජාතියට, ආගමට හොඳ සේවයක් කරන්න. දැන් සිටම පස් පවින් වැළකී දෙමව්පියන්ට කීකරුව හොඳ ජීවිතයක් ගත කරන්න. අපට කරන්න පුළුවන් ඒ වගේ කුසල්.*

*මගෙත් ඉගෙනීම් කාලයක් තිබුණා. අපි ඒ කාලේ ඉගෙන ගත් නිසා අදටත් දුකක් නැතිව පින් දහම් කරගෙන ජීවත් වෙනවා. ඉතින් දුවේ උදයට පාඩම් කරන්න. ඉස්සෙල්ලා විනාඩි 5ක් වත් මෙත් සිත පුරුදු කරන්න. ඔයාගෙ අධ්‍යාපනයටත් එය රුකුලක් වෙයි. ලිපියක් එවීමට ප්‍රමාද වූවාට සමාවෙන්න.*

*ඔබටත්, දෙමාපියන්ටත්, නැගණියටත් නිදුක් නිරෝගී සුව, දීර්ඝායුෂ පතමි. කරන කියන ධාර්මික කටයුතු, අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවා!*

*අප මේ කුසල් රැස් කරන්නේ අපගේ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේත්, අනෙකුත් පින්වත් ස්වාමීන් වහන්සේලාත් නිසයි. ඔබට මේ සමඟ රු.5000ක මුදලක් ලැබීමට සලස්වන්නම්. එයින් පාසලට අවශ්‍ය පොත් හා සපත්තු යුගලක් ගන්න. නංගිටත් පොත් ටිකක් අරන් දෙන්න. ඉතින් නවතින්නම්.*

*තෙරුවන් සරණයි..!*

*මෙයට කැපකරු මව.*

# ආදරණීය අම්මේ... තාත්තේ...

## මේ ඔබෙන් ලද මහගු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*ආදරණීය කැපකරු අම්මේ, තාත්තේ,*

*ඔබලාගේ සැපදුක් කෙසේ ද? සුවෙන් ඇතැයි මම සිතමි. මම සුපුරුදු ලෙස සරසවි අධ්‍යාපනය ලබමි. දැන් මා තුන්වන වසරෙහි අවසන් අර්ධ වාර්ෂකය සම්පූර්ණ කර අවසන් වී මේ දිනවල අවසන් විභාගයට සූදානම් වෙනවා. තව වසරක් පමණයි සරසවියේ අධ්‍යාපනය ලැබීමට තිබෙන්නේ. හිතේ පුංචි දුකක් තිබුණත් ඊලඟ වසර අවසානය වන විට විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂවේදී) උපාධිය හදාරා නිම විය යුතුයි. තව පාඨමාලාවන් 9ක් පමණ හැදෑරීමට තියෙනවා. තවද මා හට මේ වන තෙක් හැදෑරූ පාඨමාලාවන්හී විභාග ප්‍රතිඵල අනුව මේ වන විට දෙවන පංති ඉහළ සාමාර්ථයක් පවත්වාගෙන යාමට හැකි වී තිබෙනවා. මාගේ අනාගත බලාපොරොත්තුව රාජ්‍ය සේවයට සම්බන්ධ වී රටට සේවය කිරීමට යි.*

*ආදරණීය අම්මේ, තාත්තේ,*

*මා පසුගිය අර්ධ වාර්ෂිකයේ වාර අවසාන විභාගයෙන්* (A) *සාමාර්ථ 3ක්* (A-) *සාමාර්ථයක් හා (ඊ) සාමර්ථයක් ලබාගත්තා. විශ්වවිද්‍යාලයේ දී පැවැත්වෙන විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට හැකි සෑම විට ම සහභාගී වෙනවා. ඒ වගේ ම එම ක්‍රියාකාරකම් තුළින් බොහෝ කුසලතා වැඩිදියුණු කරගැනීමට හැකියාවක් ලැබුණා. මෙවන් වටිනා අවස්ථාවක් ලබා ගැනීමට ඔබතුමා, ඔබතුමිය විසින් මාසිකව මා වෙත ලබාදෙන්නා වූ ශිෂ්‍යාධාර මුදල බොහෝ සේ වැදගත් වුණා.*

*මා උසස් පෙළ අධ්‍යාපන කටයුතු කරන කාලයේ පටන් මේ වනතුරු මාසිකව මා වෙත ලබා දෙන්නා වූ එම ශිෂ්‍යාධාර මුදලින් ආහාරපාන, සබන්, ලිපිද්‍රව්‍ය, පෑන්,*

ෆොටෝකොපි සහ අවශ්‍ය කරන සටහන් ආදිය මිලට ගන්නවා. තවද බස් ගාස්තු ආදිය සඳහා ද මා වැය කරන්නේ එම මුදල්. එය මාගේ දෙමව්පියන්ට ද ඉතා විශාල සහයෝගයක්. එදිනෙදා අව්වේ වැස්සේ තෙමි තෙමී කුලී වැඩ කරමින් ජීවන විදයම සොයා ගැනීමට වෙහෙස වන මාගේ දෙමාපියන්ට සහනයක් වී මාගේ අධ්‍යාපන කටයුතු කරගැනීමට හැකි වන්නේ මාගේ කැපකරු මව, පියා මා වෙත පිරිනමන්නා වූ මෙම වටිනා උපකාරය නිසයි. ඒ පිළිබඳව නිතරම මාගේ දෙමාපියන් ද සිහිපත් කරමින් ආදරණීය ඔබතුමාට, ඔබතුමියට පුණ්‍යානුමෝදනා කරමින් ඔබ ඇතුළු ඔබගේ පවුලේ සියලු දෙනාගේ සියලු කටයුතු සාර්ථක වේවා'යි ප්‍රාර්ථනා කරනවා. පෙර සංසාරේ බැඳීමකට හෝ මෙම භවයේ දී මාගේ කැපකරු මව, පියා මේ වගේ විශාල වූ මුදල් ප්‍රමාණයක් වැය කරන්නේ මාගේ දිවිය ආලෝකමත් කිරීමට යි. ඔබ වෙහෙස මහන්සියෙන් උපයන ධනයෙන් විශාල මුදලක් මා වැනි ආර්ථික අපහසුතා වලින් පෙළෙන මා වැනි දරුවන්ට අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගැනීමට, ජීවිතය ජය ගැනීමට ඔබතුමා, ඔබතුමිය කරන්නා වූ උපකාරය 'දාන පාරමිතාවක්' ම වේවා'යි මා ප්‍රාර්ථනා කරනවා. තවද අප මේ ගෙවන සසර කෙළවර උතුම් වූ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන උතුම් වූ නිර්වාණ සම්පත්තිය ලබා ගැනීමට හේතු වාසනා වේවා! මේ දාන පාරමිතාව උපකාරයක් ම වේවා!

ආදරණීය අම්මේ, තාත්තේ,

මෙම වාරයට අදාළව ද මාසික ශිෂ්‍යාධාර මුදල් මා වෙත ලැබුණා. එම මුදලින් විශාල ප්‍රමාණයක් මා වියදම් කළේ ආහාර, ලිපිද්‍රව්‍ය හා සටහන් පිටපත් ලබාගැනීමට යි. තවද මට හැකි අවස්ථාවලදී නංගිලාට පොතක් පෑනක් ලබාගැනීමට, පංතියට යාමට බස් ගාස්තු මෙම ශිෂ්‍යාධාර මුදලින් ලබා දෙනවා. එවිට මට මහත් සතුටක් දැනෙනවා. "ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව" වැඩසටහන ශිෂ්‍යාධාර මුදල් ලබාදෙන වැඩසටහනක් පමණක් ම නොවේ. අධ්‍යාපනය ලබන දරුවන්ට පිං දහම් කිරීමට යොමු කරවන පවුලේ සහෝදර සහෝදරියන්ට දෙමාපියන්ට උදව් කිරීමට සිත් යොමු කරන, දහම් අවබෝධය දියුණු කරවන වැඩසටහනක්. මා බොහෝ විට නිවසට පැමිණෙන අතරතුර අතර මග

බොහෝ විට විවිධාකාර රෝගී තත්වයන්ට පත් වුණ, අබ්බගාත වුණ මිනිසුන් මුණ ගැසෙනවා. එවිට මට හැකි පමණ පුංචි මුදලකින් ඔවුන්ට උපකාරයක් කිරීමට මම එම මුදල් යොදාගන්නවා. එම පිං ඔබතුමාටත්, ඔබතුමියටත් අනුමෝදන් කරමි!

මෙම වාරයට අදාළව මා වෙත එවා තිබූ දහම් පුස්තකයේ ඉතාම වටිනා දහම් කරුණු අඩංගුව තිබුණා. නිසරු දෙය නිසරු දෙය ලෙසත්, සරු දෙය සරු ලෙසත් දැකීමට හැකි පුද්ගලයා සරු දෙය ලබා ගන්නා බව උපතිස්ස කෝලිත කලපාණ මිතුරන් ඇසුරු කිරීමේ වටිනාකම කියා දෙනවා. තවද ඉතා කුඩා ස්ථානයකින් පටන් ගෙන දියුණු විය හැකි බව චුල්ලසෙට්ඨි ජාතකයෙන් පිළිබිඹු වුණා. තවද සරණ සිහිකරමු පරිච්ඡේදය යටතේ 'ඡත්ත මානවක ගාථා, මෝර පිරිතෙහි එන ගාථා රත්නයක්, 'නමෝ තේ...' යන ගාථා රත්නයත් නිතර භාවිත කිරීමෙන් අපට ලැබෙන අනුසස් මනාව පැහැදිලි කරනවා. තවද එහි මෝර පිරිත ගායනා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ද ඇතුළත් ව තිබුණා. එම පිරිත එදිනෙදා බුද්ධ වන්දනාවෙන් පසුව පිරිත් සජ්ඣායනා කිරීමට එකතු කර ගත්තා. මෙවැනි වටිනා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අපගේ ගෞරවනීය ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයටත්, මාගේ ආදරණීය කැපකරු අම්මටත්, තාත්තටත් මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා. ඔබ සැමගේ සියලු කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා!

තෙරුවන් සරණයි!

මෙයට කැපකරු දියණිය

*නමෝ බුද්ධාය!*

*මාගේ ආදරණීය කැපකරු අම්මේ/තාත්තේ,*

*මේ ලිපිය ලියන්නේ ඔබේ ශිෂ්‍යත්වලාභී දියණිය වන අංජලිකා දියණිය විසින් ය. මාගේ අම්මා/තාත්තා සුවෙන් සිටිනවා ද? මාගේ අධ්‍යාපන ගමන සාර්ථක කරගැනීමට අවශ්‍ය අධ්‍යාපන උපකරණ, මුදල් ආධාර ලබාදෙමින් මාගේ දිවිය ආලෝකමත් කිරීමට වෙර දෙන මාගේ අම්මාගේ/තාත්තාගේ සියලු වැඩ කටයුතු සාර්ථක වේවා'යි කියා මා ප්‍රාර්ථනා කරනවා. එමෙන් ම ඒ කුසල කර්මයෙන් ඔබතුමාට/තුමියට මේ බියකරු සසරෙන් එතෙර වීමටත් නිවන් අවබෝධ වීම පිණිසත් හේතු වේවා'යි කියා මා ප්‍රාර්ථනා කරනවා.*

*ආදරණීය කැපකරු අම්මේ/තාත්තේ,*

*මම මේ ලිපිය ලියන්නේ ගොඩක් ලොකු සතුටකින්. මාගේ ආදරණීය කැපකරු අම්මා/තාත්තා විසින් මා වෙත එවා තිබුණු ත්‍යාග පාර්සලයේ මාගේ අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය සියලුම පාසල් උපරකරණ ගොඩක් තිබුණා. මාගේ හිතට ලොකු සතුටක් දැනුණා. ලස්සන පාටින් පාසල් උපකරණ ගොඩක් තිබුණා. එවැනි පාසල් උපකරණ ගොඩක් මාගේ අම්මටයි, තාත්තාටයි එකවර ලබාදීමට හැකියාවක් නැහැ. මාගේ කැපකරු අම්මාගෙන්, තාත්තාගෙන් මේ තරම් විශාල වූ උපකරණ ලබා ගැනීමට හැකි වුණේ මා පෙර ආත්මයක කරන ලද පිනක් නිසාදැයි සිතුණා. මාගේ කැපකරු අම්මාට, තාත්තාට බොහෝ ම පින්සිදු වෙනවා මේ කරන උපකාරවලට. මම ගොඩාක් සැරයක් ඒ පාට පාට පාසල් උපකරණ බැලුවා. හිතට ලොකු සතුටක් දැනුණා. ඒ වගේ ම ලබන අවුරුද්දෙ ඉස්කෝලෙට අවශ්‍ය බඩු අරන් දෙන්න මගේ අම්මටයි, තාත්තටයි ලොකු වියදමක් යන්නෙ නැති වෙයි. ඒ වෙනුවෙන් මාගේ කැපකරු අම්මටයි, තාත්තටයි මා ගොඩක් ස්තූතිවන්ත වෙනවා. තවද ඔබතුමා, ඔබතුමිය විසින් එවා තිබූ තෑගි වවුචරයෙන් මම පාසල් සපත්තු ජෝඩුවකුත්, මේස් ජෝඩු දෙකකුත්, දහම් පාසැල් දැමීමට බාටා සෙරෙප්පු දෙකකුත් මිලදී ගත්තා. මම ඔබට ස්තූතිවන්ත වෙනවා.*

ආදරණීය කැපකරු අම්මේ/තාත්තේ,

මම දැනට 8 ශ්‍රේණිය (ඒ) පන්තියේ ඉගෙනුම ලබනවා. පාසලේ වාර පරීක්ෂණය ජූලි මස අවසානයේ පැවැත්වුණා. මම එයට සාර්ථකව මුහුණ දුන්නා. විද්‍යාව හා ගණිතය විෂයන් නම් ටිකක් අමාරුයි. මේ වර්ෂයේ දෙවන පාසල් වාරය අවසන් වුණා. මේ වර්ෂයේ ද මම ඉංග්‍රීසි භාෂා දින හා සිංහල භාෂා දින තරඟ සඳහා සහභාගී වුණා. එහි දී ඉංග්‍රීසි භාෂා දින අත් අකුරු තරඟ සඳහා සහභාගී වී කලාප මට්ටමින් ප්‍රථම ස්ථානය හා පළාත් මට්ටමින් ද ප්‍රථම ස්ථානය ද ලබාගැනීමට හැකි වුණා. ඉංග්‍රීසි භාෂා දින සමස්ථ ලංකා තරඟ සඳහා සහභාගී වීමට මේ දිනවල පුහුණු වෙනවා. සිංහල භාෂා දින තරඟවල ප්‍රතිඵල නම් තවම ලැබුණේ නැහැ. ඒ වගේ ම දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම්වල මව් ගුණ, පිය ගුණ ගායනය තරඟය සඳහා මා සහභාගී වෙනවා. ඒ සඳහා මේ දිනවල පුහුණුවීම් කටයුතුවලට සහභාගී වෙනවා.

මාගේ අනාගත බලාපොරොත්තුව වෛද්‍යවරියක් වී අසරණ රෝගීන්ට සේවය කිරීම යි. ඒ වෙනුවෙන් මම වෙහෙස මහන්සි වී අධ්‍යාපන වැඩ කරනවා. මාගේ ආදරණීය අම්මා, තාත්තා විසින් ලබාදෙන මාසික ශිෂ්‍යාධාර මුදලින් තමයි මම ඉංග්‍රීසි හා ගණිතය පංතියට යන්නෙ. තවද මා හට එදිනෙදා අවශ්‍ය වන පෑන්, පැන්සල්, පොත් ආදිය ලබා ගන්නේ ද එම මුදලින්. එමනිසා අම්මාට, තාත්තාට ද ඒ වෙනුවෙන් ලොකු වියදමක් යන්නේ නැහැ.

ආදරණීය කැපකරු අම්මේ/තාත්තේ,

මාගේ ලොකු අක්කා දැනට විශ්වවිද්‍යාලයේ තුන්වන වසරේ ඉගෙනුම ලබන අතර පොඩි අක්කා මෙවර උසස් පෙළ විභාගයට වාණිජ අංශයෙන් පෙනී සිටියා. අප තිදෙනාම අධ්‍යාපනය ලබන නිසා අපේ අම්මාට, තාත්තාට කුලී වැඩ කරමින් ගොඩක් මහන්සි වීමට සිදුවෙලා අත්වල කරගැට එනකම් අව්වෙ වැස්සෙ තෙමි තෙමී එදිනෙදා කුලී වැඩ කරමින් බොහෝ වෙහෙස මහන්සි වෙනවා. වැස්සේ තෙමි තෙමී කුලී වැඩ කරලා අම්මා, තාත්තා ගෙදර එන්නෙ සවස් වෙලාවට යි. අම්මයි, තාත්තයි වැඩ කරනවා දැක්කම මට හිතට ගොඩක් දුකයි. මා හට හැකි සෑම විටම ගෙදරදොරදී

ඔවුන්ට උදව් කරනවා. අපට ජීවිතය ජයගැනීමට හැකි වන්නේ අධ්‍යාපනය හරි හැටි ලබාගතහොත් පමණි. එම නිසා වෙහෙස මහන්සි වී මම හොඳින් ඉගෙනගන්නවා. මම වගේ දුප්පත් දරුවන්ට ජීවිතය ජයගන්නට ලබාදෙන ශක්තිය නිසා මගේ කැපකරු අම්මාට/තාත්තාට පින් සිදු වේවා!

මා වෙත ලබාදෙන ශිෂ්‍යාධාර මුදලින් සෑම මාසයේ ම ගණිත පන්තියට රු.400කුත්, ඉංග්‍රීසි පන්තියට රු.400කුත් අවශ්‍ය වන පෑන් පැන්සල් මිලදී ගැනීමටත් බොහෝ විට තාත්තට වැඩට යාමට හා සහෝදරියට පංති යෑමට බස් ගාස්තු මුදල් නොමැති වෙලාවට එම මුදලින් මුදල් ලබාදෙනවා.

මාගේ කැපකරු අම්මේ/තාත්තේ,

ඔබ විසින් මා හට ලබාදෙන දහම් පුස්තකයේ ඉතාමත් හොඳ වටිනා දහම් කරුණු සඳහන් වී තිබුණා. කල්‍යාණ මිත්‍ර ආශ්‍රයේ වටිනාකම, කෝලිත උපතිස්ස කථා වස්තුවේ සටහන්ව තිබුණා. ඒ වගේ ම චූලසෙට්ඨි ජාතකයෙන් උත්සාහය, නුවණ තියෙන කෙනා ඉතා සුලුවෙන් පටන් ගෙන දියුණු වෙනවා යන පාඩම අපට ඉගෙන ගන්න පුළුවන්. මෙවැනි ගුණධර්ම රාශියක් මේ දහම් පුස්තකයේ ඇතුළත් වුණා. ඒ ගුණධර්ම මම මාගේ ජීවිතයට එකතු කරගෙන රටට දැයට වැඩදායී දරුවෙකු වීමට අධිෂ්ඨාන කරගන්නවා. මාගේ කැපකරු අම්මටත්, තාත්තටත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයටත්, පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ කාර්ය මණ්ඩලයටත් පිං අනුමෝදන් කරනවා. නිදුක් නිරෝගී සුව ලැබේවා'යි කියා මා ප්‍රාර්ථනා කරනවා. උතුම් වූ නිර්වාණ සම්පත්තිය අවබෝධ වේවා!

තෙරුවන් සරණයි!

මෙයට කැපකරු දියණිය



# දේවධම්ම ජාතකය

## දේව ධර්මය කුමක් දැයි විමසූ දියරකුසාගේ කථාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

අපි කව්රුත් දැන් මිනිස් ලොව ඉපදී සිටියාට අතීත සසරේ නොයෙක් ආත්මවල ඉපදුන අය. නොයෙක් නොයෙක් සත්ව තලවල උපන්න අය. ජීවිතේ සැබෑ ස්වභාවය කතා කරන ධර්මය ඇති කාලෙක එය දැන ගන්න පරිසරයක උපදින්න ලැබෙන්නෙ කලාතුරකින්. බුදු සසුනක් ලැබෙන්නේ ඉතාම කලාතුරකින්.

මේ කථාවෙන් කියැවෙන්නේ බුදු සසුනේ පැවිදි වූ ටිකක් වයසක පහේ හිතුවක්කාර භික්ෂුවක් ගැනයි.

සැවැත්නුවර සැදැහැවත් ගැමි ගෙදරක් තිබුනා. ගෙදර ස්වාමියයි බිරිඳයි දෙන්නාම නිතර දෙව්රමට යනවා. බණත් අහනවා. දානෙත් දෙනවා. මේ උදවියට දරුවෝ නෑ. කලක් යද්දී බිරිඳ අසනීප වුනා. බෙත්හේත් කළාට සුව වුනේ නෑ. ඈ මිය ගියා. සැමියා තනි වුනා. එතකොට ඔහු මෙහෙම කල්පනා කළා.

"දැන් අපේ හාමිනේත් නෑ.... මං විතරක්... මේ ගෙදරට වෙලා තනියම ජීවත් වෙන එකේ කිසි තේරුමක් නෑ.... ම්.... මටත් දැන් පැවිදි වෙන්නයි තියෙන්නෙ."

ඉතින් ඔහු සංඝයාට මෙකරුණ දන්වල පැවිදි වෙන්න කැමැත්ත පළකළා. ඊට පස්සේ ගෙදර තිබුනු මුදල් යොදවල ටිකක් ඈතට වෙන්න කුටි කීපයක් හදවා ගත්තා. කුස්සියකුත් හදවා ගත්තා. බඩු ගබඩාවකුත් හදවා ගත්තා. ගබඩාවේ ගිතෙල් සහල් පිටි ආදිය පුරවලා පැවිදි වුනා. පැවිදි වෙලා ගෙදර හිටිය දාසයන්ව කැඳවා ගත්තා. තමන් කැමති කැමති ආහාර පාන හදවාගෙන වළඳමින් විවේකීව වාසය කළා. දවසක් තම සේවකයන් ලවා තමන් ගේ සිවුරු පිරිකර බඩු මුට්ටු අව්වේ වේලෙන්න දැම්මා.

එදා බොහෝ ජනපදවාසී භික්ෂූන් වහන්සේලා සේනාසන චාරිකාවේ සැරිසරා වඩිද්දී මේ භික්ෂුව ගේ කුටි සංකීර්ණයටත් වැඩියා. හැම තැනම සිවුරු පිරිකර වේලෙන්න දාලා.

"ඇවැත්නි.... මේ ස්ථානයේ ගොඩාක් භික්ෂූන් ඉන්නවාද?"

"අනේ නෑ ඇවැත්නි.... මං විතරයි ඉන්නේ..."

"ඈ...! වෙන්න බෑ.... එතකොට මේ සිවුරු පිරිකර බඩු මුට්ටු ඔක්කෝම ඔබ ගේ තනි පාවිච්චියට ද තියෙන්නේ....?"

"එහෙමයි... ඇවැත්නි... මට එතකොට පහසුයි."

"ඒ කියන්නෙ ඇවත.... මේ සිවුරුත්.... අර සිවුරුත්..... මේ අඳන... අර අඳන.... මේ පොරෝනා.... අතන තියෙන පොරෝනා.... මේ ඇතිරිලි.... අර ඇතිරිලි.... ඒ හැම එකක් ම ඔහේ ගෙ ද?"

"එහෙනම්... ඔව්... ඔව්.... ඕවා මයේ මිසක් වෙන කාගෙද....!"

"හප්පේ... ඇවත.... ඉතාම සරල ජීවිතයක් ගැන උගන්වන බුදු සසුනේ පැවිදි වෙලා මදෑ ඔහේ කරගත්තු හරිය.... දහ දෙනෙකු ගේ පිරිකර නොවැ.... හා... හා.... යමු ඇවත්නි.... භාග්‍යවතුන් වහන්සේ ළඟට ගිහින් මේ ගැන සැළකරමු. ධර්ම මාර්ගයට උදව් ලැබෙන විදිහට අපි සරල කරගනිමු."

එතකොට ඒ වයසක භික්ෂුව එයට අකමැති වුනා. අකැමැත්තෙන්ම භාග්‍යවතුන් වහන්සේ ළඟට කැඳවාගෙන ගියා.

"ඇයි... මහණෙනි... ඔය භික්ෂුව අකැමැත්තෙන් වගේ කැඳවාගෙන එන්නේ."

"ස්වාමීනී.... භාග්‍යවතුන් වහන්ස.... මේ භික්ෂුව ළඟදි පැවිදි වුනේ. ධර්මය ඉගෙනීමට හෝ සතිපට්ඨානය වැඩීමට උනන්දුවක් නෑ. අඳන සිවුරු මහත් රාශියක් ගොඩ ගසාගෙන, බඩු ගොඩාක් එකතු කරගෙන මහා සංකීර්ණ බවට පත් වෙලා. සරල බව පේන තෙක් මානයේ නෑ.... කිසි තේරුමක් නැති බහුභාණ්ඩික වෙලා......"

"හැබෑද භික්ෂුව... මේ කියන්නේ... ඔබ බහුභාණ්ඩිකයෙක් වුනාද...?"

"එහෙමයි.... භාග්‍යවතුන් වහන්ස."

ඇයි... භික්ෂුව... නිකම් බඩු ගොඩ ගහගෙන දුක් විඳින්නේ... නිතර දස කථාවෙන් කල් ගෙවන්න කියන්නේ සරල බව ඇති කරගෙන මේ නිවන් මගට උපකාරී වෙන්නයි. භික්ෂුව මම වර්ණනා කරන්නේ අල්පේච්ඡව අඩු ආශාවෙන් වාසය කිරීම ගැනයි. ලද දෙයින් සතුටු වීම ගැනයි. හුදෙකලාවේ භාවනාවෙන් විසීම ගැනයි. පිරිස් සමඟ එකතු වී නොසිටීම ගැනයි. පටන් ගත් වීරිය ඇති බව ගැනයි.... ඉතින් භික්ෂුව, ඔබත් කැමැති විය යුත්තේ ඒ සරල බවට යි."

එතකොට ඒ වයසක භික්ෂුවට හොඳට ම කේන්ති ගියා. " හරි වැඩක් නොවැ. එහෙනම් මට කියන්නේ මෙන්න මේ විදිහට ඉන්න කියලද" කියලා ඒ භික්ෂුව පොරොවා ගෙන සිටිය සිවුර ගලවල බිම දැම්මා. අඳනය පිටින් හිටගෙන සිටියා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

යහපත පිණිස අවවාදයක් කරද්දී එයට කිපී පිරිස් මැද සිවුර උනා දාපු මේ වයසක පැවිද්දා ගැන භාග්‍යවතුන් වහන්සේට මොනතරම් අනුකම්පා හිතෙන්න ඇද්ද. භාග්‍යවතුන් වහන්සේ මෙහෙම වදාළා.

"භික්ෂුව..... ඉස්සර ආත්මෙක ඔබ දිය රකුසෙක් වෙලා ඉපදිලා හිටියා. රකුසෙක් වෙලත් ලැජ්ජා භය දෙකේ අරුත සොයමින් ඔබ දොළොස් අවුරුද්දක් වෙහෙසුනා..... දැන් බලන්න.... නිවන් ලබාදෙන බුදු සසුනක පැවිදි වෙලත් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිස මැද්දේ කිසි වගක් නැතිව පොරොවා ගත්තු සිවුරත් පැත්තකට දාලා ලැජ්ජා භයත් පැත්තකට දාලා සිටගෙන ඉන්නවා නොවැ. එතකොට ඒ භික්ෂුවට ලැජ්ජා බය හටගත්තා. ඉක්මනින්ම බිම නැමී සිවුර අරගෙන පොරොවා ගත්තා. ශාස්තෘන් වහන්සේට වන්දනා කළා. එකත්පස්ව වාඩි වුනා. ඒ භික්ෂුව දිය රකුසෙක්ව ගත කළ ජීවිතේ ගැන දැනගන්න එතන හිටිය භික්ෂූන්ට ආසා හිතුනා. ඒ කාත් කවුරුත් නොදන්න කතාව කියාදෙන්න කියල භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා සිටියා.

"මහණෙනි, ගොඩාක් ඉස්සර කාලෙ කසී රට බරණැස් නුවර බ්‍රඹදත් කියල රජෙක් හිටියා. ඒ කාලේ බෝධිසත්වයෝ ඔය රජ්ජුරුවන්ගේ අගමෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගත්තා. මේ කුමාරයට මහිංසාස යන නම ලැබුනා. මහිංසාස කුමාරයා දුව පැන සෙල්ලම් කරන අවදියේ රජ බිසොවට තවත් පුතෙක් ලැබුනා. ඔහුට චන්ද කුමාරයා යන නම ලැබුනා. ඒ චන්ද කුමාරයා දුව පැන යන කාලෙ මේ කුමාරවරුන්ගේ මව මරණයට පත්වුනා. රජතුමා ගොඩාක් දුකට පත්වුනා. ටික කලක් ගත වෙද්දී වෙනත් බිසොවකට අගමෙහෙසි තනතුර ලැබුනා. අලුත් අගමෙහෙසියටත් පුතෙක් ලැබුනා. ඒ පුතුට සූරිය කුමාරයා යන නම ලැබුනා. ඒ සූරිය කුමාරයාත් හරී ලස්සනයි. පුත් කුමරු දුටු රජතුමාගේ සතුට ඉහවහා ගියා.

"මා ප්‍රිය දේවී.... මේ සිඟිත්තා හරීම ලස්සනයි නොවැ. මට අද හරී සතුටුයි.... දේවී.... ඔයා මගෙන් කැමැති වරයක් ඉල්ලන්න. ඒ ඕනෑම වරයක් මං ඉටු කරන්නම්."

"දේවයන් වහන්ස... මටත් අද ගොඩාක් සතුටුයි. සතුට වැඩිකොම ද මන්දා.... දැන් මේ වෙලාවෙ එහෙම කිසි වරයක් ගැන මගේ සිතට එන්නේ නෑ.... අනේ මං පස්සෙ කියන්නම් හොඳේ...."

දෙවෙනි අගබිසොව සූරිය කුමාරයා යොවුන් වයසට එනකල් ඇඟිලි ගනිමින් බලා සිටියා. දවසක් රජු සතුටින් ඉන්න වෙලාවක් බලලා වරය ඉල්ලුවා.

"දේවයන් වහන්ස... මං මේ කියන්නේ... එදා... ඔබවහන්සේට හොඳ...ට මතකයි නොවැ... අපේ සූරිය කුමාරයා උපන්දා... ඒ වෙලාවේ අපි හැමෝ... ම... හිටියේ... හරීම... සතුටින් නේ... ඉතින්.... දේවයන් වහන්සේට මතකයි නොවැ... අර ඉල්ලන්න කියපු... වරය..."

"ඔව්.... දේවිය... මොකදෑ මට අමතක.... මටත් මතකයි.... හා... හා... ඉතින්... කියන්ට..."

"ඉතින් දේවයන් වහන්ස.... අපේ මේ සූරිය කුමාරයාට.... ඔව්.... අපේ සූරිය කුමාරයාට රජකම ලැබෙන්න ම ඕනා..... ඒකයි මං ඉල්ලන එකම වරය......!"

එතකොට රජතුමා ගේ මූණ වෙනස් වුනා. ඇස් ලොකු වුනා. අගබිසොව දිහා රවලා බැලුවා.

"හෑ.... මොකාක්.... රජකොම.... කාටෙයි රජකොම.... සූරිය කුමාරයාට. ඇයි.... නුඹ දැක්කෙ නැද්ද.... මහා ගිනි කඳන් වගේ බැබළි බැබළී ඉන්න මගේ අනිත් වැඩිමහල් පුත් කුමාරවරු...?... නුඹ සිහි විකල්ලෙන් ද ඉන්නේ....."

"හානේ... දේවයන් වහන්ස.... ස්ත්‍රීන් රවට්ටන්ට බොරුවට වරයක් දෙනවා කියලා දැනගත්තොත් රට්ටු මක්කා කියාවිද...

තමුන්ගෙ අගබිසව්ටත් වංචා කොළා කියලා... මං එහෙනම්... අඬබෙර ගස්සනවා.... එදා..... එදා.... ඔ... ඔබවහන්සේ එහෙනම් මාව රවට්ටන්ටද එහෙම කි... කිව්වේ... අයියෝ... මේ වරය ඉටු නොකොළොත් ඔබවහන්සේට මහා කැළලක් වේවි....."

දෙවෙනි අගබිසොව අතාරින්නෙ නෑ. ඇත් පස්සෙන් පන්න පන්න රජ්ජුරුවන් ගේ වරය ඉල්ලනවා. බැරිම තැනේදි රජතුමා වැඩිමහල් කුමාරවරු දෙන්නාට කතා කළා.

"මයෙ පුත් කුමරුනේ.... මගෙන් බරපතල අත්වැරැද්දක් වුනා. අපේ සූරිය කුමාරයා උපන් දා සතුට වැඩිකොමට මං අපේ අගබිසොවට වරයක් දුන්නා..... දැන් ඈ සූරිය කුමාරයට රජකම ඉල්ලනවා. මං ඒකට කැමැති නෑ. ස්ත්‍රීන් විශ්වාස නෑ.... පුතාලාට කිසියම් අනතුරක් කරවන්ට බැරි නෑ.... ඒ නිසා පුත්කුමරුනේ.... වනාන්තරේට ගොහින් ජීවත් වෙන්න. මගෙන් පස්සෙ ඇවිත් කුල සන්තක නගරයක රාජ්‍යය කරන්ට" කියල දරු දෙන්නාව වැළඳගෙන හැඬුවා. පුත් කුමරුන් ගේ නළල සිඹ්බා.

ඉතින් ඒ කුමාරවරු පියරජුට වන්දනා කළා. රජමැදුරෙන් පිටත් වෙලා ගියා. රාජාංගනේ සෙල්ලම් කරමින් සිටි සූරිය කුමාරයා මෙය දැක්කා. "අයියණ්ඩී... මාත් එනවා.... ඔයාල නැතිව මං මෙහෙ ඉන්නෙ නෑ" කියල ඔහුත් ඔවුන් සමග පිටත් වුනා. හිමාලයට ම ගියා.

බෝධිසත්වයෝ අතරමග ගිමන් හරින්ට රුක් සෙවනක වාඩිවුනා. තම බාල සොහොයුරු ඇමතුවා.

"මල්ලියේ... සූරිය... ආන්න අර ඇත පේන විලට ගොහින් කැමති නම් නාගෙන, පැන් බීලා මටත් නෙළුම් කොළේකට පැන් අරගෙන එන්න"

ඒ විලේ දිය රකුසෙක් ඉන්නවා. ඔහු වෙසමුණි දෙව්රජුගෙන් වරම් ගත්තු කෙනෙක්. මේ විලට බසින අයගෙන් යමෙක් දේවධර්මය දන්නවා නම් ඔහුව බිලි ගන්ට වරම් නෑ. දේව ධර්මය නොදන්නා අය වතුරට බැස්සොත් බිලිගන්ට අවසර තියෙනවා.

ඉතින් සූරිය කුමාරයා මොකෝවත් විමසන්නේ නැතිව විලට බැස්සා විතරයි දියරකුසා ඔහුව අල්ලා ගත්තා.

"හා....! දැන් කියාපිය.... දේව ධර්මය යනු කුමක්ද....?"

ඔහුට එක්වරම හිතාගන්න බැරිව ගියා. ඔහු මෙහෙම කිව්වා. "අනේ... රාක්ෂසය... දේව ධර්මය කියන්නේ චන්ද්‍රයාට යි සූර්යයාට යි නොවැ."

"හහ්.... හහ්... හා... තෝ.... දන්නේ නෑ" කියල දිය රකුසා සූරිය කුමාරයාව දිය යට තමන්ගේ වාසස්ථානයේ සිර කළා.

බෝධිසත්වයෝ මග බලාගෙන ඉන්නවා. වතුරත් නෑ. සූරිය කුමාරයත් නෑ. "මල්ලියේ... චන්ද... සූරිය ගියා තවම ආවේ නෑ. ඔයා යන්න. ගිහින්... මල්ලිවත් එක්කරගෙන මටත් නෙළුම් කොළේකට පැනුත් අරගෙන එන්න."

චන්ද කුමාරයත් කෙලින් ම ගිහින් විලට බැස්සා විතරයි. දියරකුසා අල්ලා ගත්තා. දේව ධර්මය යනු කුමක් දැයි ඇසුවා. ඔහු කීවේ දේව ධර්මය යනු සතර දිසාව කියලයි. උත්තරය වැරදියි. ඔහුවත් දිය යට රකුසු භවනේ හැංගුවා.

සොයුරන් දෙන්නා ම ගියා ගියා ම යි. ආවේ නෑ. ඒ ගමන බෝසත් කුමාරයා පිටත් වුනා. විල අසල සිටගෙන හොඳින් වටපිටාව විපරම් කළා. 'ම්... විලට බැහැපු අඩිපාර තියෙනවා. විලෙන් ගොඩ

වුන කෙනෙකුගේ අඩිපාර ජේන්ට නැහැ නොවැ...... මෙතැන තියෙන ගුප්ත ස්වභාවයේ හැටියට නම් රකුසෙක් වත් ඉන්නවාද දන්නෑ. කෝකටත් මං සූදානමින් ඉන්න ඕනා' කියලා කඩුවත් ලෑස්ති පිට තියාගත්තා. දුනු ඊතලත් මානා ගත්තා. එතකොට වනාන්තරේ සිට පුරුෂයෙක් ආවා. බෝසතුන්ට මෙහෙම කිව්වා.

"භවත් පුරුෂය... මොකද ඔය.... විලට භය වෙන්නෙ මොටද.... ගමන් වෙහෙසකුත් තියෙනවා වගෙයි.... විලට බහින්ට... හොඳට වතුර නාගන්ට.... පැනුත් බොන්ට..... නෙළුම් අලත් කාලා.... මල් මාලෙකුත් ගොතාලා.... පැළඳගෙන.... නිවී හැනහිල්ලේ යන්ට එපායැ..."

එතකොට බෝසතාණෝ ඔහු දිහා බැලුවා. "ම්... මොහු ඇසි පිය හෙලන්නේ නෑ..... ඔය.... හෙවනැල්ලත් නෑ..... මාවත් විලට බස්සවන්නයි හදන්නේ. මොහු වෙන්න ඕන මේ විලට අරක් ගත් යක්ෂයා...." කියල සිතාගෙන ඔහු ඇමතුවා.

"එම්බල යක්ෂය.... ඇත්ත කියාපන්... මගේ සහෝදර කුමාරවරු දෙන්නව ගත්තේ නුඹ නේද?"

"ඔව්... මං තමයි."

"ඇයි... එහෙම කළේ?"

"මේ විලට බහින අයව මට බිලිගන්ට පුළුවනි."

"ඒ කියන්නේ මේ විලට බහින සියලු දෙනාම බිලිගන්ට පුළුවන් ද?"

"බෑ... දේව ධර්මය දන්නා අයව බිලිගන්ට බෑ. අනිත් අයව පුළුවනි."

"එම්බල යක්ෂය.... නුඹට දේව ධර්මයෙන් ප්‍රයෝජනයක් තියෙනවාද?"

"අනේ ඔව්... මං හරී ආසාවෙන් ඉන්නේ මොකක්ද මේ දේව ධර්මය කියලා දැනගන්ට."

"හරි... මං දේව ධර්මය දන්නවා."

"එහෙනම්.... කුමාරය... දේව ධර්මය කියන්න මට."

"කොහොමද මං මෙහෙම අපවිත්‍ර ශරීරයකින් යුක්තව දේව ධර්මය කියන්නේ...."

එතකොට දියරකුසා මහිංසාස කුමාරයාව සිහිල් දියෙන් නැව්වා. භෝජන අනුභව කෙරෙව්වා. පැන් පෙව්වා. සුවඳ මල් මාලාවක් පැළැන්දුවා. අලංකාර මණ්ඩපයක් මවලා ඇතිරිලි දාපු වටිනා අසුනක් පිළියෙල කළා. බෝධිසත්වයෝ ආසනේ වාඩි වුනා. රකුසාව බිමින් වාඩි කෙරෙව්වා.

"යක්ෂය... එහෙනම්... හොඳින් සවන් යොමු කොට අසාග න්න. මං දැන් දේව ධර්මය කියන්නයි යන්නේ" කියල මේ ගාථාව පැවසුවා.

**"හිරිඔත්තප්ප සම්පන්නා - සුක්කධම්මසමාහිතා**
**සන්තෝ සප්පුරිසා ලෝකේ - දේවධම්මාති වුච්චරේ"ති.**

'කුසල් දහමට එක්ව පවතින -පවට ලැජ්ජාවත් භයත් දෙක
දේව ධර්මය කියා මෙලොවේ -ශාන්ත සත්පුරුෂයෝ පවසති'

ඊට පස්සේ ඒ දියරකුසා ඉතා සතුටු වුනා. ඒ ගැන විස්තර කියාදෙන්න කියල කිව්වා. බෝධිසත්වයෝ ලැජ්ජා, භය දෙක ගැන ඉතාම ලස්සනට විස්තර කළා. "යක්ෂය.... කයෙන්

කෙරෙන දුශ්චරිත තියෙනවා. සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය ආදියයි. ඒ වගේ ම වචනයෙන් කෙරෙන දුශ්චරිත තියෙනවා. බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම ආදියයි. මනසින් කෙරෙන දුශ්චරිත තියෙනවා. අන්සතු දේ තමා සතු කරගන්ට ආසා කිරීම, ද්වේෂ කිරීම, පින් පව් පිළිනොගැනීම යනාදිය යි. යමෙක් මේවා කරන්ට ලැජ්ජයි. ඒ කියන්නේ දුශ්චරිතයේ යෙදෙන්ට ලැජ්ජයි.

තමන්ව ප්‍රධාන කොට, වැදගත් කොට, උතුම් කොට, නුවණැත්තෙකු කොට කල්පනා කරලා ලැජ්ජාව උපදවා ගන්ට පුළුවනි. මං මෙහෙම කෙනෙක්. මං වගේ කෙනෙකුට මෙවැනි ලාමක දේවල් කරන්ට වටින්නේ නැහැ නොවැ කියල.

පවට භය ඇති වෙන්නේ මෙහෙමයි. "හප්පේ... මේ ලෝකේ දෙවිවරු ඉන්නවා. දිවැස් තියෙන අය ඉන්නවා. අනුන් ගේ සිත් දැනගන්න ඇහැක් අය ඉන්නවා. ඒ උත්තමයෝ මාව දැක්කොත් වස ලැජ්ජාව නොවැ. මං ඒකට නම් හරී භයයි. අනික මගේ හිත මට දොස් කියනවාට මං භයයි. වෙන කෙනෙක් මට දොස් කියනවාටත් භයයි. අනික මේ වගේ වැරදි වලට තමයි භයානක දඬුවම් තියෙන්නේ. හප්පේ.... මං මොකටද දඬුවම් ලැබෙන වැරදි කරන්නෙ.... හැමෝටම වහං වෙලා, සැඟවිලා දුසිරිතෙහි යෙදුනා කියමුකෝ.... නමුත් පරලොව නපුරු විපාකයෙන් සැඟවී පලායන්ට බැහැ නොවැ....! හප්පෙ මං නම් නපුරු විපාක ලැබෙනවාට භයයි.

යක්ෂය, ඔය විදිහට පවට ලැජ්ජාවත් භයත් ඇතිකරගන්ට ඕනා. යක්ෂය, මේ ගුණ දෙකට ලෝකයේ ශාන්තුවර සත්පුරුෂයෝ දේවධර්මය කියල කිව්වේ උත්තම ධර්මය නිසයි."

දියරකුසා සාදුකාර දුන්නා. හොඳට ම පැහැදුනා. බෝධිසත්වයන්ට මෙහෙම කිව්වා.

"මහා නුවණැති කුමාරය..... බණ ටික නම් හරි අගෙයි.... දේව ධර්මය හරි අගේට විස්තර කොළා.... ඒ නිසාවෙන් මං තමුන්නාන්සේට එක් සහෝදරයෙක් දෙනවා. හරි.... කාවද අරගෙන එන්ට ඕනා...."

"යක්ෂය.... මට බාල සහෝදරයාව ඕනා. එයාව එක්කරගෙන එන්ට."

"හපොයි... මදෑ කොළා.... ඔහේ දේව ධර්මය දන්නවා විතරයි නොවැ. පිළිපදින්නේ නැහැ නොවැ....... ඇයි ජ්‍යෙෂ්ඨයන්ට සැලකීම නොකරන්නේ. ජ්‍යෙෂ්ඨයාව අත්හැරලා කණිෂ්ඨයාව ගේන්න කියන එක ගැලපෙන දෙයක් නම් නොවෙයි. හපොයි...."

"නෑ.... යක්ෂය,.... මං දේව ධර්මයත් දන්නවා. ඒ වගේම දේව ධර්මයේ හැසිරෙනවා. මං ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ භේදය හොඳට හඳුනනවා. මෙතැන තියෙන්නේ වෙන ප්‍රශ්නයක්.

අපට මේ වනාන්තර ගතවෙන්ට උනේ කණිෂ්ඨ කුමාරයා නිසා මිසක් වැඩිමහල් කුමාරයා නිසා නොවෙයි. ඔය වැඩිමහල් කුමාරය යි මම යි එක අම්මා ගේ දරු දෙන්නා. අපේ මව් නැති වුනා. එතකොට අපගේ පියරජතුමා වෙන බිසොවකට අගබිසෝ තනතුර දුන්නා. ඔය බාලසහෝදර සූරිය කුමාරයා ඒ අගබිසොවගේ පුතා. ඉතින් ඒ සූරිය කුමාරයා උපන් දවසේ අපේ පියරජු ඒ අගබිසොවට වරයක් දුන්නා. ඒ වරය පස්සේ ගන්නම් කියලා හිට, දැන් සූරිය කුමාරයාට රජකම දෙන්න කියනවා. එතකොට අපේ පියරජු ඒ වරය දුන්නෙ නැතිව අපිට ජීවිත රැකගන්ට කියලයි වනයට එව්වේ. අපි මාළිගය අත්හැරලා එද්දී සූරිය කුමාරයා බලෙන් ම වගේ අපිත් එක්ක ආවා. මං සූරිය කුමාරයා අත්හැරලා මගේ වැඩිමහල් සහෝදර චන්ද කුමාරයා රැගෙන ගිහින් මං කීවොත් සූරිය කුමාරයා යකෙක් කෑවා කියල කවුරුවත් විශ්වාස කරන්නේ

නෑ. අපි මේ කුමාරයාට අනතුරක් කරලා ආවාය කියලා කියාවි. ඒ ගර්හාවට මං හය යි. ඒකයි වැඩිමලා ඉන්නැද්දි බාලයාව ඉල්ලුවේ."

"සාදු.... සාදු... කුමාරය... කල්පනා කොරාපු විදිහ හරි අගෙයි. තමුන්නාන්සේ දේව ධර්මයත් දන්නවා. ඒ දේව ධර්මය තුළ පවතිනවා. හරි අගෙයි. මං මේ දෙන්නාම ආපහු දෙනවා."

එතකොට බෝධිසත්වයෝ ඒ දියරකුසාට තවත් කරුණු කිව්වා. "අනේ.... මිත්‍රය.... දැන් බලන්ට.... ඔබට අපි වගේ ඉක්මනින් සුචරිතවත් වෙන්ට බැරිකමක් නැහැ නේ..... පෙර ආත්මෙක කරපු වැරදි නිසා ඒ පවට විපාක විඳිමින් මේ ආත්මේ අනුන්ගේ ලේ මස් කන යකෙක් වෙලා ඔහේ උපන්නා.... නැවතත් ඔය පව් ම නොවැ කරන්නේ.....! මේ පව් විපාක දෙන්ට ගත්තොත් නිරා දුකෙන් නම් බේරෙන්ට ලැබෙන්නේ නෑ..... එහෙම නොවෙයි... මෙතැන් පටන් ලේ මස් වලට ඇති ආසාව අත්හරින්ට. පිනට ආසා කරන්ට.... ඔය විල අත්හැරලා අපිත් එක්ක එන්ට.... ඔහේත් දේව ධර්මයේ පිහිටලා ඉන්ට...."

යකා පැහැදුනා. බෝධිසත්වයන් ගේ බසට අවනත වුනා. දමනය වුනා. ලේ මස් කෑම අත්හැරියා. පළතුරු වලට පුරුදු වුනා. යකා මේ තුන් දෙනාම හොඳින් ආරක්ෂා කරගත්තා.

දවසක් මහිංසාස කුමාරයා ආකාසේ දිහා බලාගෙන ඉන්නවා. තාරකාවල පිහිටීමේ වෙනසක් දැක්කා. පසුවදා උදේ සහෝදරයන්ට කතා කළා. මල්ලියේ.... දැන් අපට ආපසු යන්ට කාලෙ ඇවිත්.... ඊයේ රාත්‍රී තරු පිහිටීමට අනුව අපේ පියරජු අභාවයට පත් වෙලා."

ඉතින් බෝධිසත්වයෝ තම සොයුරන් දෙදෙනාත්, දියරකුසාත් රැගෙන බරණැසට ගියා. ඇමැතිවරු බෝධිසත්වයන්ට රාජ්‍යය පැවරුවා. බෝසත් රජු චන්ද කුමාරයාට යුවරජකමත්,

සූරිය කුමාරයාට සේනාපතිකමත් පැවරුවා. රාජ උද්‍යානේ රමණීය පොකුණක් අසල යකාට දෙවොලක් හදලා දුන්නා. අග්‍ර මල්මාලා වලින්, අග්‍ර පුෂ්පවලින්, අග්‍ර භෝජනයෙන් උපස්ථාන ලැබෙන්න සැලැස්සුවා.

බලන්න මහණෙනි, එදා දියරකුසා වෙලා හිටියේ අද සිවුරු අහකට දාලා ලැජ්ජා භය නැතිව පිරිස් මැද සිටගත් මේ බහුභාණ්ඩික භික්ෂුව. චන්ද කුමාරයා වෙලා ඉපදී හිටියේ අපේ සාරිපුත්ත. සූරිය කුමාරයා වෙලා ඉපදිලා හිටියේ අපේ මේ ආනන්දයන්. මහිංසාසක කුමාරයා වෙලා උපන්නේ මං නොවැ” කියා වදාළා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

එදා ජාතක කතාව අහපු ඒ බහුභාණ්ඩික භික්ෂුව සසර ගැන ගොඩාක් කලකිරුනා. නිවන් මගේ වටිනාකම ඉතා හොඳින් පැහැදිලි වුනා. යෝනිසෝ මනසිකාරය උපන්නා. සෝවාන් ඵලයට පත්වුනා.



# සුගති රැකවරණ සලසන අසිරිමත් ගාථා

එක් ව්‍යවහාරික වර්ෂයක් ගෙවිලා තවත් ව්‍යවහාරික වර්ෂයක් උදා වෙනවා. ඔබත් දැන් තවත් වසරකින් ලොකු මහත් වූ දූ පුතුන්... ලබන පාසල් වාරයේ පටන් ඉහළ ශ්‍රේණියක යි ඔබ ඉගෙනුම ලබන්නේ. දැන උගත්කම් වගේ ම ගුණ යහපත්කම්, මේ වසර තුළ උපයා ගත්තු වත්පොහොසත්කම් බවට පත් කරගෙන, එළඹෙන ව්‍යවහාරික වර්ෂයේ ඔබේ අධ්‍යාපන කටයුතුත් - සියලු ධාර්මික කටයුතුත් සුව සේ සිදු කර ගන්න උතුම් තෙරුවනේ ආශීර්වාදය හිමි වේවා කියා අපත් මෙත් සිතින් දුවලා පුතාලා හැම දෙනාට ම සුභ පතනවා.

අපගේ සම්බුදුරජාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයේ සිදු වූ එක්තරා සිදුවීමක් ප්‍රස්තුතය කරගෙන ඔබට මෙවර දහම් පණිවිඩය ලබා දීම සුදුසු යි කියා අප සිතුවා. මේ පුවත ඔබ අසා තිබෙන්නක්. ඒ වගේ ම, එහි දැක්වෙන උතුම් ගාථාවන් සජ්ඣායනය කොට තෙරුවන් සිහි කිරීමත් අප කාටත් ළමා අවදියේ පටන් ම හුරු දෙයක්...

දුවේ පුතේ, අපගේ ශාස්තෘන් වහන්සේ එක්තරා දවසක උදෑසන මහා කරුණා සමාපත්ති ඥාණයට සමවැදී ඒ දවසේ දී උන්වහන්සේගෙන් උපකාර ලබන්නට පින් ඇති කෙනා කවුරුන් ද යන්න විමසා වදාළා. එදා සම්බුදුරජාණන් වහන්සේ හමුවේ සරණ සීලයේ පිහිටා සරණ සලසා ගන්නට වාසනා ගුණ සහිත වූ තරුණ දරුවා දිසාපාමොක් ගුරු ගෙදර ශිල්ප හදාරා අවසන්ව ගුරු පඬුරු වෙනුවෙන් මාපියන් ලබා දුන් කහවණු දහසක් දිසාපාමොක් ඇදුරුතුමාට පුද කිරීම පිණිස ගෙන යන්නට නියමිත ව සිටියා. ඔහුගේ නම ඡත්ත.

එදා දවසේ ඔහු බුදුරජාණන් වහන්සේවත්, සද්ධර්මයත්, ශ්‍රාවක සංඝරත්නයත් සරණ යන බවත්, සීලය සමාදන් ව සීලයේ පිහිටන බවත්, කර්මානුරූප ව සොරුන්ගෙන් පහර ලැබ වස්තුව

ද පැහැර ගනු ලැබ මරණයට පත්වන බවත්, තිසරණය හා සීලය හේතුවෙන් එසැණින් දෙව්ලොව උපදනා බවත් සම්බුදුරජාණන් වහන්සේ ඒ මොහොතේ දුටුවා. ඔහු නියත වශයෙන් ම සොරුන්ගේ පහර දීමෙන් මරණයට පත් වන මේ දවසේ තිසරණයේ හා සීලයේ නොපිහිටියොත් ඔහු අපාගත වන ඉරණම ඇතිව සිටින බව ද උන්වහන්සේ දුටුවා. දුවේ පුතේ, බලන්න අප සරණ ගිය සම්බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් ඤාණ බලය... කර්ම-කර්මඵල ගැනත්, ඒ ඒ ලෝකවල උපදිනා ප්‍රතිපදාව ගැනත්, සරණ සීලයේ පිහිට ලද හැකි අයුරින් කෙනෙකු පිනෙන් මෝරා තිබේ ද නැති ද යන්න ගැනත් සම්බුදුරජාණන් වහන්සේ මොහොතින් දැන ගන්නවා. අසිරිමත් දස තථාගත බලයන් අතර ඇති ඤාණ බල කිහිපයකිනුයි ඒ විස්මිත ප්‍රඥාව උපදවා දී තිබෙන්නේ. අපි සරණ ගිය ශාස්තෘන් වහන්සේ ඒකාන්තයෙන් ම අනන්ත ප්‍රඥා මහිමයෙන් යුතුයි කියා අපිත් සිත පහදවා ගනිමු.

ඉතින් දුවේ පුතේ, සම්බුදුරජාණන් වහන්සේ එදා උදෑසන ඡත්ත තරුණ පුතා ගුරු පඬුරු ගෙන යන්නට නියමිත මාර්ගයේ අතරමග ගසක් යට ඔහුට පෙනෙන පරිදි වැඩ සිටියා. දුටු දුටුවන් නෙතු සනසන අසහාය රූප සම්පත්තියකින් යුතු වූ සම්බුදුරජාණන් වහන්සේගේ දසුන ඇස ගැටුනු සැණින් තරුණ ඡත්ත උන්වහන්සේ වෙත එළඹුණා. වන්දනා කොට එකත්පස් ව වාඩි වුණා. සතුටු සාමීචි කතාවෙන් පසුව සම්බුදුරජාණන් වහන්සේ එතෙක් තිසරණ සරණ නොගොස් සිටි ඡත්ත කුමාරයාව තිසරණයෙහි පිහිටෙව්වා. උතුම් පංච ශීලයෙහි සමාදන් කරවූවා. එද තිසරණ සරණ සිහි කරන්නට කියා ඡත්ත අරහයා සම්බුදුරජාණන් වහන්සේ කියා දුන් ගාථාවන් තමයි 'ඡත්ත මාණවක ගාථා' කියා අද දක්වා ම ව්‍යවහාරයේ පවතින්නේ. ඒ ගාථාවල තියෙන්නේ හරි ම ලස්සන අර්ථයක්. තිසරණ සිහි කිරීමක්. ඉතින් ඡත්ත මානවක ඒ සරණ ම සිහිකර කර යි මැරුණේ. හොරු ගහද්දිත් සරණ ම සිහි කළා. සරණ සිහිකර කර මැරිලා

තව්තිසාවේ මහා බල සම්පන්න දිව්‍ය පුත්‍රයෙක් වෙලා ඉපදුණා. ඡත්ත මානවකගේ තිබුණ විශේෂත්වය තමයි 'සරණ සිහිකර කර සිටීම'. මරණ වේදනාවේ දී පවා ඔහු එය අත්හැරියේ නැහැ. දූවේ පුතේ, එසේ සරණ සිහි කිරීමේ ආනිශංසයක් ලෙසින් ඔහු මරණින් මතු සුගතිගාමී වුණා.

තමන් බුදුරජාණන් වහන්සේ සරණ ගිය බව, ශ්‍රී සද්ධර්මය සරණ ගිය බව, ආර්ය මහා සංඝරත්නය සරණ ගිය බව නිතර නිතර සිහිකිරීම විශේෂ හැකියාවක්. විශේෂ භාග්‍යයක්. සුගතියේ දොර විවර වන යතුර තමා අත දරා සිටීම වැනි දෙයක්. ඒ නිසා, සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මය නිර්මල ව අසන්නට ලැබෙන යුගයක ධර්ම දායාදය ලබා උපදින්නට පරම දුර්ලභ වාසනාව ලැබූව ඔබත් අද අද ම බලවත් ව තිසරණය සරණ යන්න. යනකොට, එනකොට, හිඳිනකොට, නිදනකොට යන සිව් ඉරියව්වේ දී ම සරණ සිහි කරන්න. ඒ ආකාරයෙන් සරණ සිහි කරන්න නිතර නිතර භාවිත කළ හැකි අපූරු ගාථා තුනක් තමයි ඒ ඡත්ත මානවක ගාථා. සිංහල අර්ථයන් එක්ක හොඳින් කට පාඩම් කර ගන්න. උදේ සවස නිතර සජ්ඣායනා කරන්න.

**"යෝ වදතං පවරෝ මනුජේසු**
**සක්‍යමුනී භගවා කතකිච්චෝ**
**පාරගතෝ බල විරිය සමංගී**
**තං සුගතං සරණත්ථමුපේමි"**

"කතා බස් කරන මනුෂ්‍ය වර්ගයා අතර උත්තම වූ යම් කෙනෙක් ඉන්නවා. උන්වහන්සේ තමයි නිවන් මග සම්පූර්ණ කළ ශාක්‍යමුනීන්ද්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ. තමන් වහන්සේගේ ප්‍රඥා බල මහිමයත්, චතුරංග සමන්නාගත වීර්යයත් නිසා සංසාරෙන් එතෙරට වැඩියා. අන්න ඒ සුගතයන් වහන්සේ ව මම සාදරයෙන් සරණ යමි."

**"රාග විරාග මනේජ මසෝකං**
**ධම්මමසංඛතමප්පටිකූලං**
**මධුරමිමං පගුණං සුවිභත්තං**
**ධම්මමිමං සරණත්ථමුපේමි"**

"ධර්මයක් තියෙනවා. ඒ ධර්මයෙන් රාගය දුරුකරනවා. තෘෂ්ණාව නැති, ශෝක නැති, පිළිකුල් රහිත වූ අසංඛත නිවන ම යි ඒ ධර්මය. මේ ධර්මය මධුරයි. හොඳින් ප්‍රගුණ වෙනවා. විස්තර විභාග සහිතයි. ඒ උතුම් ශ්‍රී සද්ධර්මය මම සාදරයෙන් සරණ යමි."

**"යත්ථ ච දින්න මහප්ඵලමාහු**
**චතූසු සුචීසු පුරිස යුගේසු**
**අට්ඨ ච පුග්ගල ධම්මදසාතේ**
**සංඝමිමං සරණත්ථමුපේමි"**

"යම් ආර්ය සඟ පිරිසකට දානයක් පූජා කළ විට මහත්ඵල ලැබෙනවා කියලා කියනවා නම් උන්වහන්සේලා පාරිශුද්ධ යුගල හතරකින් යුක්තයි. ධර්මයේ පිහිටි උන්වහන්සේලා පුද්ගල වශයෙන් අට දෙනෙක් වෙනවා. මේ උතුම් ආර්ය සංඝයා මම සාදරයෙන් සරණ යමි."

දුවේ පුතේ, බලන්න මේ ගාථාවල මොන තරම් නම් සුන්දර අර්ථයක් ද තියෙන්නේ කියලා. පාසල් ඇරෙන වෙලාවේ ලවුඩ්ස්පීකර්වලින් ඇහෙන දේ අර්ථය කොච්චර මිහිරි ද? පාසලෙන් බැහැර වන්නට ඇති කලබලය නිසා අප බොහෝ දෙනෙකුට මේ උතුම් ගාථාවන් අරුත් සිහි කරමින් සජ්ඣායනා කොට පින් කර ගැනීමේ වාසනාව අහිමි වෙනවා. ඒ වගේ ම සමහර අය මේ උතුම් ගාථාවන් විකෘති කරමින් විහිළුවට ගන්නා අයුරු ද අප අසා දැක තිබෙනවා. ඉතින් කවුරු හරි ඡත්ත මානවක ගාථාවන් විහිළුවට ගත්තා නම්, සමච්චල් කළා නම්, විහිළු පද එකතු කළා

නම්, අගෞරව කළා නම් ඒ අයට පව් රැස්වෙනවා. දුවේ පුතේ, නොදන්නාකමින් හෝ ඔබ කාට හරි එසේ වී තිබේ නම් රුවන්වැලි මහා සෑ රජුන් අබියස ඡත්ත මානවක ගාථා සජ්ඣායනා කර කර ප්‍රදක්ෂිණා කරමින් භාග්‍යවතුන් වහන්සේගෙන් සමාව ගන්න. නොඑසේ නම් ඒ අඳුරු සෙවණැලි අපේ ජීවිත වසා ගනීවි. සසර ගමනේ දී අපට සරණ සීලයේ පිහිටන්නට අවස්ථා නොලැබී යාවි.

ඡත්ත මානවක ගාථා ඡත්ත මානවක දිව්‍ය පුත්‍රයාගේ විමානයේ රැව් පිළිරැව් දෙනවා. ඔහු භාග්‍යවතුන් වහන්සේ ව මුණගැහෙන්න පවා පැමිණියේ ඒ ගාථා සජ්ඣායනා කරමින්. එතකොට බලන්න මොනතරම් නම් ඔහුගේ හිතට කා වැදිල ද ඒ සරණ. අද මිනිසුන් දේවාල ගැන හිත හිතා ඉන්නේ. ණය තුරුස්, කරදර ඕවා තමයි හිතේ තිබෙන්නේ. එකිනෙකා යටපත් කරගෙන යන ආකාර ගැන හිත හිත යි ඉන්නේ. ඉතින් ඔය වෙලාවක මැරුණොත් කුමන ලෝකයක උපදීවි ද කියලා හිතන්නට වටිනවා....

ඒ වගේ ම තමයි තවත් අපූරු ධර්මයක් මේ කතාවේ තියෙනවා. ඒ තමයි අද බොහෝ දෙනා සරණ සිහි කරන්නේ, පිරිත් කියන්නේ, පින් කරන්නේ මේ ජීවිතේ කරදරවලින් ආරක්ෂාවක් පතාගෙන. භාවනාවට ගොස් පැමිණෙන කොට වාහනය හැපුණොත් භාවනාවේ බලයක් නැද්ද කියා සිතෙනවා. පින් කරන අයට කරදර එනකොට මේ පින් විපාක දෙන්නැද්දැයි සිතෙනවා. දැහැමි කෙනෙක් අඩු වයසින් මැරෙනකොට ඒක අසාමාන්‍ය අද්භූත දෙයක් විදිහටයි සලකන්නේ. ඒත් මේ බලන්න, ඡත්ත මානවක බුදුරජාණන් වහන්සේ දැකලා, බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අහලා, බුදුරජාණන් වහන්සේ ම උගන්වා වදාළ ගාථා තුනක් සජ්ඣායනා කර කර ගියේ. හොරු මොහු ව මැරුවානේ ටික වෙලාවකින්. හොරු ඡත්ත මානවකට මැරෙනකල් ම පහර දුන්නා. අද කාලේ මෙහෙම දෙයක් වුණා නම් මොනවා නො කියයි ද?

එසේ නම් තිසරණය තියෙන්නේ කුමක් සඳහා ද?

තිසරණය තිබෙන්නේ පරලොව ද සුරක්ෂිත භාවය පිණිස යි. හුදෙක් මේ ලෝකයේ ලාභ ප්‍රයෝජන පිණිස නො වෙයි. ඡත්ත මානවක දෙව්ලොව ඉපදිලා භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණිලා "මට නැවත දහම් දෙසන්න" යැයි කියා ඉල්ලා සිටියා. එවිට භාග්‍යවතුන් වහන්සේ රහතන් වහන්සේනමකගේ අවබෝධය ගැනයි වදාළේ. මනුලොව දී තිසරණය ගැන වදාළා. දෙව්ලොව දී නිවන ගැන වදාළා. අහෝ! අපගේ භාග්‍යවතුන් වහන්සේ කෙනෙකුගේ ධර්මාවබෝධ ස්වභාවය, කාලය, ආකාරය දන්නා සේක්, අසිරිමත් ම යි.

තිසරණය නිසා මෙලොව සිදුවන යම් යම් හාස්කම් නැතුවා නො වෙයි. හුදෙක් අප එය පමණක් බලාපොරොත්තු විය යුතු නෑ. මෙලොවත්, පරලොවත් අපට නිසැක පිහිට, පිළිසරණ උතුම් තිසරණය ම යි. විමාන වත්ථුවෙන් ඡත්ත මානවක විමාන වත්ථුව කියවන්න. මනුලොවට හිරුමඬල යම් සේ ද තව්තිසාවට ඡත්ත මානවක දෙව් විමන ඒ වගේ කියනවා. තව්තිසාවේ දෙව්වරු කියනවා දෙවියෙක් වෙනවා නම් ඡත්ත මානවක වගේ වෙන්න ඕන කියලා. දෙව්වරු සාකච්ඡා කරනවා "මොන මොන පින් ද මේ ඡත්ත මානවක දෙවියා කර ගත්තේ, අපිත් ඒවා කර ගනිමු." කියලා. බලන්න තිසරණය සිහිකර කර ජීවිතය අවසන් කිරීමේ පුණ්‍ය විපාක.

ඒ නිසා, දුවේ පුතේ ඔබටත් හැකි වුණොත් නිතර නිතර තිසරණය සිහි කරන්න, එය ඔබගේ විශේෂ හැකියාවක්. භාග්‍යයක්. තිසරණය සිහි කිරීම පුංචි දෙයක් කියලා හිතන්න එපා. මේ උතුම් බුද්ධ ශාසනයේ සුළු දෙයක් යැයි පෙනෙන දෙයක් නමුත් මහත් වූ විපාක සලසනවා. විශාල හස්තියෙක් වුණත් පුංචි හෙණ්ඩුවකින් දමනය වෙනවා. ඒ වගේ තිසරණය නිතර නිතර සිහි කිරීම ඒ කෙනා ව උතුම් අවබෝධයක් කරා රැගෙන යෑමට තරම් බලවත් දෙයක් වෙනවා. ඒකට ඡත්ත මානවක කතාව කදිම උදාහරණයක්.

ඔබත් අද අද ම ඡත්ත මානවක ගාථා අරුත් සහිත ව කටපාඩම් කර ගන්න. තමාගේ සරණ නිතර සිහි කරන්න. ගෞතම බුදු සසුනේ පිහිට පිළිසරණ සලසා ගන්න. ඒ සඳහා ඔබට භාග්‍යය උදා වේවා...!

## සජ්ඣායනයට පහසු ලෙස ඡත්ත මානවක ගාථාවල සිංහල පරිවර්තනය

**කතා කරන මිනිසුන්ට උතුම් වූ**
**සක්‍යමුනී භගවත් මුනිඳුන් වූ**
**බුදු කිස නිම කළ - බල වෙර පළ කළ**
**සසරින් එතෙරට වැඩි නිදුකාණන්**
**සුගත තථාගත බුදු සමිඳුණන්**
**සාදරයෙන් මම සරණ යමි...!**

**රාග කිසිත් නැති - සෝක කෙලෙස් නැති**
**පිළිකුල් බව නැති - අසංඛතයි සදහම්**
**මැනවින් පවසන - හොඳින් ප්‍රගුණ වන**
**මිහිරි උතුම් සදහම්**
**සාදරයෙන් මම සරණ යමි...!**

**යමෙකුට පිදුවොත් මහ ඵල ලැබ දෙන**
**සදහම් තුළ සිටි බුදු සව් සැමදෙන**
**උතුම් පුරුෂයින් යුගළ සතර දෙන**
**පුද්ගලයින් ලෙස වෙත් ම ය අට දෙන**
**ඒ උත්තම ශ්‍රාවක සඟරුවන ද**
**සාදරයෙන් මම සරණ යමි...!**

සාදු! සාදු!! සාදු!!!


(මහාමේඝ පුවත් සඟරාවේ පළ කෙරුණු ලිපියක් ඇසුරිනි)

# නිර්මාණ ඉසව්ව


**පැදියෙන් සිතුවමින් නිසඳැසින්**
**සුසැදි ඔබේ නිර්මාණ එකතුව**



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.ඒ. ඉෂාරා මධුශානි දියණිය විසින් එවූ නිර්මාණයක්...




2019 අ.පො.ස. (උ/පෙළ) පෙනී සිටි එච්.ආර්. හෂිනි මධුෂිකා දියණිය විසින් එවූ නිර්මාණයක්...



12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන චානුක සංදීප් රණවීර පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.එම්.ජී. සුපුන් චාරුක පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.එම්. නෙත්මි ශෂිකලා දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී.ජී.ඩී. සාරංග සදීප් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.ජී. කාවින්ද්‍යා චමෝදි ජයතිස්ස දියණිය විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.ඩී. අංජලිකා ගීතාංජලී දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.ජී. උත්පලා ගිම්හානි දියණිය විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නවීෂා නිර්මාණි දියණිය විසින් එවූ නිර්මාණයක්...



12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.පී. නවෝද් සංකල්ප පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.ජී. ධනංජ ඉසුරු උදාර පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන වී.ඒ. දිනුක තාමර පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.ඒ. ඉෂාරා මධුෂානි දියණිය විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඊ.ඒ. කළණ හසරංග පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



05 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී.එම්. චතුනි දිනාරා දියණිය විසින් එවූ නිර්මාණයක්...



12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පී.එච්. උමේෂා ඉසුරන්දි දියණිය විසින් එවූ නිර්මාණයක්...

## නවීන දියුණුව...

තාක්ෂණය දියුණු වෙලා
ලෝකය ඇත ඇඟිලි තුඩේ
අසුරු සැණින් ලොව කලඹන
වෙනසක අරුමය මැව්වේ...

ළඟ සිටිනා අය
අමතනකොට
නන්නාඳුනන අය
හිතවත්කමට ගෙන
දුරලයි කෙමෙන් මනුස්ස ගති
සතුටට මායිම් සැදිලා

දුරකථනයෙ මතක ඇතේ
විඳි සතුටක් සිතේ නැති
දියුණුව යැයි කියූ බසක්
මෙය දැයි මට සැකයි පුතේ

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන නිමායා ප්‍රියමාලි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

දස මසක් කුස දරා
රතු ලේ  සුදු කිරට හරවා
කිරි පොවා ඇති දැඩි කර
ආදරණීය මවට
පිං ලැබේවා යාමට
මේ සසර ගමනින් එතෙරට

දහඩිය වගුරුවා
ධනය උපයා
අපට සැප දීමට සිහින දකින
ආදරණීය පියාට
පිං ලැබේවා යාමට
මේ සසර ගමනින් එතෙරට

හොඳ දේ හොඳයි කියා
නරක දේ නරකයි කියා
හොඳ ගුණදම් පුරුදු කළ
ආදරණීය ගුරු මෑණියන්ට,
පියාණන්ට
පිං ලැබේවා යාමට
මේ සසර ගමනින් එතෙරට

නැණ නුවණ පාදන්නට
උපයා ගත් ධනය
පිං සිතින් අප වෙතට එවන
පින්වත් කැපකරු මෑණියන්ට,
පියාණන්ට,
පිං ලැබේවා යාමට
මේ සසර ගමනින් එතෙරට

සසර ගමන දිග බවත්
එය කෙටි කර ගැනීමටත්
නිබඳ අපට අවවාද දෙන
පින්වත් ලොකු ස්වාමීන්
වහන්සේට
පිං ලැබේවා යාමට
මේ සසර ගමනින් එතෙරට

ගුණ නවයක් ඇත්තා වූ
සියල්ලන්ට ම වඩා උතුම් වූ
සියල්ලන්ට ම විමුක්තියේ
මාර්ගය විවර කර දුන්
අපගේ ගෞතම බුදුරඳුන්ට
නමස්කාර වේවා!

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කණිෂ්කා තරුෂි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මා පිය ගුරු දෙදෙන

ජීවන මංපෙත මලින් පුදන්නට
රැකුල විය ඔබ මට අම්මා
දුන් සෙනෙහස
මහ මෙරකි සදාකල්
මිල කළ නො හැකිය මට නිම්මා
මතු භව සසරේ ලබනට ඔබහට
නිවන් මගේ සම්බුදු සම්මා
අරහත් දම්
නිති නො අඩුව ලැබෙමින්
ඔබ මතු සසරේ බුදු වෙම්මා......

කුසගිනි නොම දී
රස බොජුනින් නිති
මා රැක ගත්තා මගේ පියා
ලෝභ නොවී ඔබ නිරතුරු දුන්නා
මගෙ හද වෙත ඔබෙ අදර දයා
ඔබ මට දුන්
සෙනෙහසේ බෙලෙන්
පියතුමා මගේ ඔබ අත නොයා
හිමි කරගනු මැන
නිවන් මගේ සුව
මම පතනෙමි නිති දෑස පියා...

සිප් කිරි පොවමින් දෑස පෑදුවා
ගුරු අම්මාවරු මගේ දයා
සිප් ගඟුලේ පරතෙරටම යාමට
අත දුන්නා ගුරු පියා දයා
දියුණට යන්නට
අතහිත දුන් ඔබ
මතු භවයෙත් හමුවන්න කියා
මල් දෝතක් ගෙන යම් පුදනට
සම්මා සම්බුදු හිමි
ළඟින් තියා.....

12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුමේධා ලක්මාලි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## අහෝ...!

දිනක්
යනවිට මා තනිවම
දුටුවා
පිපෙන්නට වෙර දරන
කැකුළක්
පසු කරන් ගියා
එදා මම මගෙ ගමන
පහුවදා මම යද්දි
හිනහෙනවා සුවඳ පතුරා
විකසිතව ඒ කැකුළ
නැවතුනෙමි ක්ෂණයකට
විඳ ගියෙමි මල් සුවඳ
ඒත් අද මා එද්දි
මුකුලිතය ඒ කුසුම
නැහැ සුවඳ
ලස්සන
අහෝ...!
මා ගියෙමි
මගේ ගමන

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්. මනුජ අනුහස් පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

## අම්මා...

ලෝකයේ ඇති සුවහසක් වචන අතරින්
මා අසා ඇති පියකරුම වචනයයි අම්මා....
ලෝකයේ ඇති සුවහසක් පුද්ගලයන් අතරින්
මා දැක ඇති නෙත්කළුම නෑයා අම්මා...
ලෝකයේ ඇති සුවහසක් දිව්‍ය ඔසු අතරින්
මා හට සුවය දුන් එක ම දිව්‍ය ඔසුව අම්මා....
ලෝකයේ ඇති සුවහසක් පුද්ගලයන් අතුරින්
ම හදට ළං වූ කෙනෙකු නැත ඔබ තරම් අම්මේ....

ලෝකයේ සිටින සුවහසක් පුද්ගලයන් අතුරින් ම හදට ළං වූ, මාගේ සෑම අවස්ථාවක දී ම මා ළඟින් සිටි, මා හද සැනසූ කෙනෙකු නැත ඔබ තරම් අම්මේ...

**කනට අමයුරු, නෙතට පියකරු, හදට පෙම්බර වදනයි අම්මා...**

09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කාවින්දි සත්සරණි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මාගේ පියාණන් හට...

පළමුව ඔබ පා යුග වඳිමි
අවසරයි පියාණෙනි,
දස මස මා නොදරුව ද
ලේ කිරි කර
මා හට නොපෙව්ව ද
ආදරණීය පියාණෙනි
ඔබයි මාගේ සෙවණැල්ල....

හදවතේ වූ වේදනාව
නෙත අග රැඳුණු ඒ කඳුල
ඉපදුන දා පටන් මම
වින්දලු ඔබ මා හට සැඟව
මා උගතෙගු වූ දිනෙක
පිසලමි ඒ නෙත කඳුල...

සැඩ රළ නගන මහ සයුර නුඹයි
ලොවම සනසන සඳ කිරණ ඔබයි
ජීවිතයේ අරුත
මට කියා දුන්නේ නුඹයි
සෑම භවයක ම මාගේ පියා
ඔබයි...

13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන රශ්මි චමිල්කා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## නිවන් දකින්නෙමු සංසාරේ...

නිවන් දැකුමට මිස
නිම්මා නොවේ මේ
සංසාරේ අපි
කළ කර්මෙ.
සම්මා සම්බුදු
බුදු හිමි දෙසූ සේ
හැදී වැඩෙමු අපි
සමාජයේ
කළ හැකි පමණින්
කුසල් කර්ම මිස
අකුසලයන් මඟ හරිමු කෙසේ
නිම්මා නොවෙනා
සංසාරේ අපි
නිවන් දකින්නෙමු
මතු භවයේ

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන මිනෝද් පුලස්ති පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

## නික්මීමට පෙර,...

අවදි කර වූ යක්ෂයෝ වල
කැළඹූහ
හංසයෝ ඉගිල ගිය කල් හී
නෙක් වර්ණ දුලවූ මත්ස්‍යයෝ ද
සහේතුකව අතුරුදන් විය.
පියුම් නොතිබී ද,
නොදුටුවේ ද නොදනිමි.
ඉතිරි වූ වලෙන් වහිනින දුගඳ
දැන් දැන් දැනේ
පියුමක් ව අවදිව
අපුලෙන් මිදෙනු රිසිය
එහෙත් අපුල රිසි යක්ෂයෝ ද
තවමත් අවදියෙන්

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන හසිත මුණසිංහ පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

ඇළුම් කළ නමුත් පියාසර කරන්නට
සිර වූවා පියාපත් - අසරණකම නම් වූ කම්බි දැලක
ඉගෙනීම නම් වූ ක්ෂේම භූමිය පෙනෙන මානයේ දී ම
නමුත්
පෙර කළ පින් මහිමයේ බලයෙන්
පැමිණියා යහපත් සත්පුරුෂයන් කැළක්
සිර වූ පියාපත් නිදහස් කොට ක්ෂේම භූමිය කරා පියමනින්නට
දිරිය දුන්නා මහමෙරක් තරම්

එහෙව් දිරියක් දුන් ඔබ සැමට නිවන නම් ක්ෂේම භූමිය කරා
පියනගන්නට මෙම පින් බලය ශක්තියක් ම වේවා...!

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෂිණි මධුෂිකා දියණිය විසින් එවූ නිර්මාණයක්....

## පිය ගුණ...

මිණි පහනකි දිලෙන එළියෙන් සිත නිවන
සඳ කැලුමකි අඳුරු රැය වෙත එළිය දෙන
මඳ පවනකි හමන සිහිලෙන් ගත තෙමන
පිය සෙනෙහසයි හැම දරුවන් නිති පතන

නොවුනද ඔබේ වී රතු ලේ කිරි ලෙසට
වැගිරෙන දහඩියයි කුසගින්නේ බත් පතට
දුන්නේ ඔවා මිණි ළංවී හද වෙතට
ඉරහඳ වුණත් දෙන්නම් හැකි වුණොත් මට

පිය සෙනෙහසයි මහමෙර උස හද පතුලේ
බිය සැක මුසුව දුක හා සිතුවිලි පෙරලේ
දිලෙනා හිරු නුඹයි තුන්යම මිහි මඬලේ
ඇසෙනා සීනු හඬ ඔබවෙයි දිවි දෙවොලේ

පිය ඔසවන විටදි සෙවනැල්ලකි නිබඳ
මිතුරෙකි ළංව දුක විමසන නිති සබඳ
පානා සෙනෙහසයි දරුවන් වෙත නොමඳ
බුදුබව ලැබේවා පතනෙමි දෙපා වැඳ

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගෝතමී හංසමාලි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මගේ අප්පච්චී...

මහ පොළවයි ඉර අව්වයි සමඟින් සටනේ වැදෙමින්
මගෙ සුදු අම්මයි මාවයි කුසගින්නේ නොම තබමින්
ඔබ කලුගල් කැඩුවා මගෙ අනාගතය ගැන සිතමින්...

ආදරයට ඇති අක්ෂර හතරේ අරුත කියාදෙමින්
ජීවිතයට එන බාධක ගැන මා හට හඳුන්වමින්
රැඳෙන්න ඔබ මා අසලින් මා හට පළිහක් විලසින්...

මාගේ දෙනෙතින් වැටෙනා කඳුලු බිංදු පිසදාමින්
දුක මැද්දෙන් හිනා වෙන්න කියා මෙමට උගන්වමින්
අප්පච්චී ඔබ රැඳෙන්න මාගේ වීරයා ලෙසින්...

වරදින තැන් හඳුනාගෙන එය නිවැරදි කර ගනිමින්
නිරතුරුවම පාඩම් කර විභාගයෙන් සමත් වෙමින්
බාධක මැඩගෙන දුවනා මීටර් සියයක් විලසින්
මතකයි ඔබ මට කීවා සැම තැන නිති ජය ලබන්න.

ඔබ වැපිරූ ඒ කමතේ සරු අස්වැන්නක් විලසින්
දිසාපතිනියක් බිහි වෙයි කෙදිනක හෝ අම්පාරෙන්
මගේ අප්පච්චී කිය කිය ඔබ වෙත මා දුව ඇවිදින්
වඳිනෙමි මා දණ ගාමින් ඔබගේ පා පියුමින්...

10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. සචිනි ප්‍රබෝධ්‍යා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## කළ ගුණ නො සලකන මිනිසුනි, සොභාවධර්මයට....

ඊසානෙන් එන සුළංවලින්
දැනුණේ අපට සිසිලකි වෙනදා නිතින්
මේ සති ගණන දැනුණේ වෙහෙසකි මනසේ
වෙනදා නැති හෙණ ගිණි අකුණු කඳන්
අද ඇත සියොත් මඟ අසුරා විසිරී....

ඊසාන දිග මෝසම් දිගත මඳුවිත වන් දෙසැම්බරේ,
කළ හදිය රූපවාහිනී තිරයේ,
මා හද තුළ කැකෑරේ ගිණි ඇවිලේ,
ගංගා, ඇළ දොළ, වැව් කළුවර ලා
භූමිය ඉරී තලා ලා
කඳු වැතිරේ මව් මාතා මතට
කඳුළු සලා ලා.....

සොබාවධර්මයට නො සලකන මිනිසුන්නේ,
ඇයි නොතේරෙන විලසින්නේ,
බුදුරදහුගෙ සත් සතියේ
ආදර්ශය ඇතේ ඔබ යා යුතු දිවි ගමනේ....

රන් දොරගුළු විවර වේ කළගුණ
දත් මිනිසාගේ,
ආ මග කෙටියි, යා යුතු මග දුර සසරේ,
වෙහෙසෙන්න නිවන් අවබෝධ කරගන්න
මේ දිවි ගමනේ.....

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්. රාධිකා පුන්සරා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ජීවන ගමන...

ගෙවා යා යුතු දුර බොහෝ ය
ඒ අතර නොයෙකුත් දෙසට මංපෙත්ය
නිවැරදිම මග තෝරාගෙන,
ඒ මග ගමන් කළ යුතු ය.
බාධක කම්කටොළු බොහෝ ය
ඒ හැම දරාගෙන ජයගත යුතු ය
එවිට හැකිවේය දිනුමට ජීවන ගමන....

නොයෙකුත් දනා මුණගැහෙන මග
නොවී කිසි සේ ප්‍රමාද
තම දිණුම ගැනම සිතා,
ඉටුකර ගත යුතුය
තම අරමුණ....

නොපෙලා කිසිවෙකුත්,
ඔවුනුත් රැගෙන දියුණුව කරා
යා හැකි වේ නම් කිසිවෙකු හට
ජීවන ගමන ජයගත් අයෙක් වේමය සදා....
පෙර තම අසරණකම් මෙනෙහි කරමින්
බුදුරදුන් පෙර දෙසූ ලෙසට ම
හැකිවේ නම් අත දෙන්නට කෙනෙකුන් හට
ඔවුන් වේමය ලොව දිනූ දනන්
සැමදා....

13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන හෂිනිකා ගයන්ති
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මෙත් කුළුණු ගුණ වපුරමු...

ජාති කුල මල කිසික් නෑ
එක මව්ගෙ තුරුලට එක්වෙමු
වෛර දුරලමු භේද දුරලමු
සැමට මෙත් ගුණ පතුරමු

සතම වනසන ලොවට
විණ දෙන
බලවේග හැම බිඳලනු
හැම දෙනට මෙත් වඩා
ලෝකයේ
සාමයේ මල් පුබුදමු

සියලු ආගම් සමඟ සමඟිව
මෙත් කුළුණු ගුණ වපුරමු
අනුන් යහපත තකා අන්පණ
තම පණට සම කරවමු.

රුදුරු වෙස් ගත් නපුරු දුදණන්
ගන්න සුමඟට වෙහෙසෙමු
හෙට දිනේ යළි ලක් මවුන් තුළ
නිහඬ සාමය රජයමු.

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ශ්‍රීෂිකා කේෂාණි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## නිර්මාණය....

නැගෙන ලෙසට
සයුරු රළ...
නො නැවතී රෑ දිවා
සිතිවිලිත් ඒ වගෙයි
නිමක් නැත හඹා එයි
පසිඳුරන් දඟ නිසා
රැක්ම දුෂ්කර තමා
දෙනෙත් හැර බැලුවොතින්
කමටහන් නොවැ සැමා....
සිත පුහුණු කළ යුතුයි
ඇවැසි තැන දා උපා
තව තවත් වී පමා
දූලක පැටලෙනු එපා
ගත්ත දින සිත නිවා
සිල් සුවඳ එයි හමා
කරගෙන ම පව් කමා
සුවය විඳගමු අමා....

10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. සචිනි ප්‍රබෝධ්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්....

අරුත් තේරුම් ගනිමින් මිහිරට සජ්ඣායනා කරන්න.

## රතන සූත්‍රය

01. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

භූත පිරිස් කිසිවෙකු මෙහි සිටිත් ද රැස් වුන
අහසේ හෝ පොළොවේ හෝ ඒ හැම එක් වුන
සියළු භූතයෝ සැප ඇති සිත් ඇති වෙත්වා !
එමෙන් ම මා පවසන දෙය හොඳින් අසත්වා !

02. තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

සියළු භූතයිනි එනිසා - අසව් යොමා සිත
මෙත් සිත පතුරව් නිතර ම - හැම මිනිසුන් වෙත
ඒ කිසිවෙක් තොපට හට පින් - දිව රෑ පුද දෙත
පමා නො වී තෙපි ඒ හැම - නිති සුරැකිය යුත

03. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

මෙහි හෝ පරලොව හෝ ඇති - යම් වස්තුවකට
දෙව්ලොව හෝ තිබෙනා යම් - උතුම් ම මැණිකට
නො හැකිය ගන්නට කිසි විට - බුදු රජ සම කොට
මෙය බුදු සමිඳු ගෙ පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

04. භයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

කෙලෙස් නසන වීතරාගි - අමා නිවන යුතු
යම් දහමක් ලැබුයේ නම් - මුනිඳු සමාහිත
ඒ දහමට සම කළ හැකි - කිසිවක් ලොව නැත
මෙය සදහම් තුළ පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

05. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

බුදු සමිඳුන් අගය කළේ - "හොඳ" යයි යමකට
සමාධිය යි එය, අතරක - නොරැඳෙන කිසිවිට
ගත නො හැකිය කිසිවක් ඒ - සමවත සමකොට
මෙය සදහම් තුළ පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

06. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉධම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

පුද්ගලයෝ අට දෙනෙක් ය - හොඳ අය පසසන
හතර දෙනෙකි මේ උතුමන් - යුගල විලස ගෙන

මේ අය බුදු සච්චෝ වෙති - දනට සුදුසු වන
මහත් ඵලය ලැබදෙයි - මෙතුමන්ට පුදන දන
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

07. **යේ සුප්පයුත්තා මනසා දළ්හේන**
**නික්කාමිනෝ ගෝතමසාසනම්හි**
**තේ පත්තිපත්තා අමතං විගය්හ**
**ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යමෙක් පිළිවෙතින් යුතු වෙ ද - මනසින් දැඩි කොට
නික්මෙන හැම කෙලෙසුන් ගෙන් - බුදු සසුනෙහි සිට
ඒ උතුමන් පැමිණිය පසු - සුන්දර නිවනට
වළඳති සුවසේ නිවන ම - සිතු සිතු විලසට
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

08. **යථින්දඛීලෝ පඨවිංසිතෝසියා**
**චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ**
**තථූපමං සප්පුරිසං වදාමි**
**යෝ අරියසච්චානි අවෙච්ච පස්සති**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

සිට වූ ගල්ටැඹක් විලස - පොළොවේ දැඩි ලෙස
සතර දිගින් එන සුළඟින් - නො සැලේ කිසි ලෙස
යමෙක් "ආර්ය සත්‍ය " දකිත් නම් - මෙහි ඇති ලෙස
ඒ සත්පුරුෂයට කියමි මෙය - උපමා ලෙස
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

09. යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤේන සුදේසිතානි
කිඤ්චා'පි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ගැඹුරු නුවණ ඇති බුදු සමිඳුන් - පවසන ලද
"ආර්ය සත්‍යයන්" මැනැවින් දුටු - යමෙකුන් වෙද
භවයේ රැඳෙමින් කොතරම් - පමාව සිටිය ද
ඔවුන් නො එත්මය අටවැනි - භවයට කිසි ලෙද
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවා'පි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ඔහු තුළ ඇති වන විට දී ම - මඟ ඵල නුවණත්
සංයෝජන තුනක් ම දුරු වෙයි - තම සිතිනුත්
සක්කාය දිට්ඨියත් සමඟ - දහමේ සැකයෙනුත්
සීල ව්‍රතයට බැඳී තිබෙන - මේ කරුණේනුත්
සතර අපායෙන් හෙතෙමේ - මිදෙයි මනා කොට
නො කරයි සය තැනෙක කර්ම - වැටෙන අපායට
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

11. කිඤ්චා'පි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

කිසියම් පව් කමක් ඔහු ගෙ අතින් කෙරුන විට
කයින් වචනයෙන් හෝ චේතනාව මුල් කොට
එය සඟවා ගෙන සිටින්ට නො හැකිය ඔහු හට
දහමකි මෙය සදහම් දැක ගත්තු කෙනා හට
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

12. වනප්පගුම්බේ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයී
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ගිම්හානේ පළමුව එන - වසන්ත කාලෙට
මල් ඵල බර වෙයි වනගොමු වල - සිරියාවට
දෙසූ සේක උත්තම සිරි සදහම් - එලෙසට
පරම සුවය සදමින් එය - ගෙන යයි නිවනට
මෙය බුදු සමිඳුගෙ පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

උතුම් මුනිඳු උතුම් දහම් දැන - එය බෙදමින
දෙසූ සේක උතුම් අනුත්තර - සදහම් බණ
මෙය බුදු සමිඳු ගෙ පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

14. **ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්තචිත්තා ආයතිකේ භවස්මිං**
**තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

වැනසුනි හැම පැරණි කර්ම - යළි නොම රැස් වෙන
නො ඇලෙයි සිත අනාගතේ - කිසි භවයක් ගැන
වැනසී ගිය බිජුවට කිසි දා - නො ම පැළ වෙන
නිවෙති රහත් සඟ නිවෙනා - මෙ පහන විලසින
මෙය බුදු පිරිසෙහි පවතින - උතුම් ම මැණිකකි
සැබෑ බසින් මෙම - සෙත සැලසේවා !

15. **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛෙ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු**

භූත පිරිස් කිසිවෙකු මෙහි සිටිත් ද රැස් වුන
අහසේ හෝ පොළොවේ හෝ ඒ හැම එක් වුන
දෙව් මිනිසුන් හැම පුද දෙන "බුදු සමිඳුන්" වන
නමදිමු අපි ඒ බුදු රජ - සෙත සැලසේවා !

16. **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛෙ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හෝතු**

භූත පිරිස් කිසිවෙකු මෙහි සිටිත් ද රැස් වුන
අහසේ හෝ පොළොවේ හෝ ඒ හැම එක් වුන
දෙව් මිනිසුන් හැම පුද දෙන "බුදු සමිඳුන්" වන
නමදිමු අපි සිරි සදහම් - සෙත සැළසේවා !

**17.** **යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යානිව අන්තලික්ඛෙ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**සංඝං නමස්සාම සුවත්ථි හෝතු**

භූත පිරිස් කිසිවෙකු මෙහි සිටිත් ද රැස් වුන
අහසේ හෝ පොළොවේ හෝ ඒ හැම එක් වුන
දෙව් මිනිසුන් හැම පුද දෙන "බුදු සමිඳුන්" වන
නමදිමු අපි බුදු පිරිස ද - සෙත සැළසේවා !

**ඒතේන සච්චේන සුවත්ථි හෝතු!**
මේ සත්‍යානුභාවයෙන් සැමට සෙත් වේවා!